ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"නමුත් අපි කුරුසියෙහි ඇණගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දේශනාකරමුව....." *(1 කොරින්ති 1:23)*

82 වන වෙළුම අංක 02 (968) **2023 මැයි / ජූනි**

බලාපොරොත්තු බිඳවැටීම-පිඹීමේ ආරම්භයයි

ජේ.සී. රයිලි විසිනි

පිඹීම පිළිබඳ කාරණයේදී එය අපට ඉතා සරල විය යුතුය. පිඹීම යනු යේසුස් වහන්සේගේ ජීවනය මනුෂ්‍යයාගේ හදවත්වලට වැගිරවීමයි. යේසුස් වහන්සේ සෑම විටම ජයග්‍රාහිකව සිටින සේක. ස්වර්ගයේදී උන්වහන්සේගේ ජයග්‍රහණය ගැන නිරන්තරයෙන් උන්වහන්සේට ප්‍රශංසා කරන්නෝය. අසාර්ථකත්වය සහ වඳභාවය පිළිබඳව අපගේ අත්දැකීම කුමක් වුවත් උන්වහන්සේ කිසි විටෙකත් පරාජය නොවේ. උන්වහන්සේගේ බලය අසීමිතය. අපගේ කාර්යය වන්නේ උන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවයකට එළඹීම පමණක් වන අතර උන්වහන්සේගේ බලය අපගේ හදවත්, ජීවිත සහ සේවය තුළ ප්‍රදර්ශනය වන බව අපට පෙනෙනු ඇත. උන්වහන්සේගේ ජයග්‍රාහී ජීවිතයෙන් අපව පුරවා අනිත් අයගේ ජීවිත වෙතට ගලායාමට සලස්වන සේක. එය පිඹීම තුළ ඇති සාරයයි.

දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව බිඳීමට ලක්විය යුතුය.

කෙසේ වෙතත් අපි දෙවියන් වහන්සේ සමඟ මෙම නිවැරදි සම්බන්ධතාවයට පැමිණීමට නම් අපි ඉගෙන ගත යුතු පළමු දෙය වන්නේ අපගේ කැමැත්ත උන්වහන්සේගේ කැමැත්තට අනුව බිඳී යා යුතු බවයි. බිඳී යාම යනු පිඹීමේ ආරම්භයයි. එය වේදනාකාරීය. එය නින්දා සහගතය. නමුත් එකම මාර්ගය එයයි. මම ලෙස සිට ගැනීම නොව නමුත් ක්‍රිස්තුස් වහන්සේ ලෙස යටහත් විය යුතුය. **"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි. එසේ වී නමුත් මම ජීවත්වෙමි. නමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මාංශයෙහි ජීවත්වෙන ජීවිතය මට ප්‍රේම කළා වූ, මා උදෙසා තමන්ම පාවාදුන්නා වූ දෙවියන් වනහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලනේ ජීවත් වෙමි."** (ගලාති 2:20) යේසුස් වහන්සේට අප තුළ සම්පූර්ණයෙන්ම ජීවිත්වීමටත්, අප තුළ තිබෙන උඩඟුකමේ ආත්මය බිඳී යන තෙක් උන්වහන්සේව අප තුළින් ප්‍රකාශ කිරීමටත් නොහැකිය. මෙයින් අදහස් කරන්නේ තමාව සාධාරණීයකරණය කරන තමාගේම මාර්ග යට කැමති, තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින සහ තමාගේම ගෞරවය සොයන දැඩි නොනැසී පවතින ආත්මයයි. අවසානයේ දෙවියන් වහන්සේගේ කැමැත්තට හිස නමා වරද පිළිගෙන තමගේ මාර්ගය යේසුස් වහ්සේ උදෙසා අත්හරින බවයි. එහිදී අයිතිවාසිකම් යටත් කර එහි තේජන ඉවත දමයි. යේසුස් වහන්සේට සියල්ල තිබෙන අතර උන්වහන්සේ සියල්ල වන සේක. තවත් ආකාරයකින් පවසන්නේ නම් තමාටම සහ තමාගෙ ම ආකල්පවලට මරණය පත්වීමයි.

ඒ වගේම අපි අපගේ කිතුණු ජීවිතය දෙස අවංකව බලන විට අප සැම කෙනෙකු තුළම මෙම ආත්මික ස්වභාවය කොපමණදැයි අපට දැකිය හැකිය. බොහෝ දෙනා ක්‍රිස්තියානි ජීවිතය ගත කරන්නට උත්සාහ කරන්නේ තමන්ගෙ ම ශක්තියෙනි. බොහෝ විට කිතුණුවන් වැඩ කරන්නේද එම ශක්තියෙන්මය සැමවිටම කෝපයට ඊර්ෂ්‍යාවට, අමනාපය, විවේචනයට කණස්සල්ලට පත්වන්නේ තමා මිස අනිත් අය කෙරෙහි දක්වන ආකල්පය දැඩි හා නොනැමෙන ස්වභාවයේ තබා ගන්නා තැනැත්තා තමාමය. ලැජ්ජාශීල නිහඬව සිටින (තමාගේ හැගීම් ලෙහෙසින් පාලනය නොකරන) තමා ගැන ඕනෑවට වඩා සිතන තැනැත්තා තමාමය. එබැවින් අපට බිඳීමට ලක්වීමට සිදුවීම පුදුමයක් නොවේ. දෙවියන් වහන්සේ අපව පිරවීමට ආශා කරන්නේ ආත්මයාණන් වහන්සේගේ ඵල වලිනි. (ගලාති 5:22) දැඩි හා නොනැමුණු බව දෙවියන් වහන්සේගේ කැමැත්තට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ බැවින් තමන් තමන්ගේම පාලකයා ලෙස පවතින තෙක් දෙවියන් වහන්සේට අප තුළ ක්‍රියා කළ හැකි වන්නේ ස්වල්ප වශයෙනි. නොබිඳුණා වූ ආත්මය අප තුළ පවතින විට එය කුරුසියේ ඇණගැසිය යුතු බව හඟවාදෙයි.

අපි එසේය.., ස්වාමීනි., කියා කියමු.. ?

බිඳියාමට සැලැස්වීම දෙවියන් වහන්සේ අප හා එක්ව කරන ක්‍රියාවකි. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ පීඩාව අපට දරා ගැනීමට සලස්විය. නමුත් ඊට එකඟවීම අපි තෝරාගත යුතුය. අපි දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවයේ ප්‍රධාන කොන්දේසිය ආලෝකයට කැමතිවීමයි. දෙවියන් වහන්සේට වේදනා ඇති කරන උඩඟු , දැඩි , ආත්මයේ ප්‍රකාශනයන් දෙවියන් වහන්සේ අපට පෙන්වනු ඇත. අපට පසුතැවිලිවීම ප්‍රතික්ෂේප කිරීමට හෝ දණින් වැටී ඔව් ස්වාමීනී, කියමින් පසුතැවිලිවීම තෝරා ගැනීමට හැකිවන්නේ එවිටය. දෛනිකව බිඳ වැටීමේ අත්දැකීම යනු දෙවියන් වහ්නසේ පෙන්වාදෙන දෙයට නිහතමානීව දක්වන ප්‍රතිචාරයයි. මෙම වටහාදීම නොකඩවා පවතින බැවින් අපි නොකඩවා බිඳ දැමිය යුතුය. මෙය අධික මිලක් ගෙවිය යුතු කාර්යයක් විය හැකිය. මෙයට අයිතිවාසිකම්, ආත්මාර්ථකාමී අවශ්‍යතා සමහර විට පසුතැවිලීම සහ වන්දි ගෙවීමක් ඇතුළත්විය හැකිය.

යේසුස් වහන්සේ අප වෙනුවෙන් බිඳීමට ලක් වූ සේක.

මේ හේතුව නිසා යේසුස් වහන්සේගේ කුරුසියේ දී හැර අප බිඳීමට ආශා විය යුතු තැනක් නැත. අප වෙනුවෙන් බිඳීමට යේසුස් වහන්සේ තුළ වූ කැමැත්ත අප බිඳියාමට ලක්වීමේ බලගතු චේතනාවයි. දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් සිටින යේසුස් වහන්සේ දෙවියන් වහන්සේට සමානව සිටීම අල්ලාගෙන සිටිය යුතු දෙයක් ලෙස නොගෙන එය අප වෙනුවෙන් අතහැර දෙවියන් වහන්සේගේ සේවකයෙකු සහ මනුෂ්‍යයාගේ සේවකයෙකුගේ ස්වරූපය ගත් බව අපි දකින්නෙමු. උන්වහන්සේට තමන්ගේම අයිතිවාසිකමක්, තමන්ගේම නිවසක් දේපලක් නොමැත. මනුෂ්‍යයාගේ නින්දාවට හසුවීමට උන්වහන්සේ කැමති වූ සේක. උන්වහන්සේ නැවත හැරී නින්දා නොකළ සේක. තමන්වම ආරක්ෂා කර ගැනීමට ක්‍රියා නොකළ සේක. ගසමතදී තම ශරීරය තුළ මනුෂ්‍යයාගේ පව් දරාගෙන නිහතමානීව උන්වහන්සේ කල්වාරියට යන විටදී බිඳී යන ආකාරය අපි දකින්නෙමු.

දුක්මුසු අනාගතවාක්‍යමය ගීතිකාවක මෙසේ පවසන්නේය. **"මව නව් මනුෂ්‍යයෙක් නොව පණුවෙකිමි. මිනිසුන් අතරෙහි නින්දිතයෙක්මි. සෙනඟ විසින් හෙළා දක්නා ලද්දෙක්මි."** (ගීතාවලිය 22:6) නිවර්තන කලාපයේ සිටින අය සර්පයා සහ පණුවා අතර වෙනස අපට පැහැදිලි කරන්නේ ඔවුන් පහරදීමට උත්සාහ කරන විටදීය. සර්පයා තමන්ම නැගී සිටින අතර ඝෝෂා කරමින් නැවත පහරදීමට උත්සාහ කරයි. නමුත් පණුවෙකු කිසිදු විරෝධතාවයක් පෙන්නුම් නොකරයි. එම නිසා පණුවාව පයින් පාගා ගැනීමට, පයින් ගැසීමට පුළුවන. එය සැබෑ බිඳියාමේ පින්තූරයකි. එමෙන්ම මනුෂ්‍යයෙක් නොව පණුවෙක් වීමට යේසුස් වහන්සේ කැමති වූ සේක. උන්වහන්සේ එසේ කළේ අපගේ පාපය කරුණු කොටගෙන අපගේ අයිතිවාසිකම් පණුවෙක් මෙන් අහෝසි කරගෙන, අපාය හිමිකරගෙන සිටින බව උන්වහන්සේ දුටු නිසාය. තවද දැන් උන්වහන්සේ අපට කථා කරන්නේ උන්වහන්සේ වෙනුවෙන් සහ උන්වහන්සේ සමඟ පණුවන් ලෙස අපගේ නියම ස්ථානය ගන්නා ලෙසයි. කන්ද උඩ මුළු දේශනාවෙන් පළිනොගැනීම, සතුරන්ට ප්‍රේමකිරීම, පරාර්ථකාමීව පරිත්‍යාග කිරීම අපගේ ස්ථාවරය විය යුතු බව උගන්වයි. නමුත් ඒ සඳහා කැමැත්තෙන් සිටීමට අපව පෙළඹවිය හැක්කේ බිඳියාමට කැමති වූ ආදරයේ දර්ශනයට පමණි. "ස්වාමීනී ...., මා වෙනුවෙන් කල්වාරිය මත හිස නැමූ යේසුස් වහන්සේව දකිමින් මගේ දැඩි, උඩඟු බෙල්ල නමන්න, හිස නමා මිය යන්න මට උදව් කරන්න. "

නිරන්තර යටහත්වීම

මමත්වය උදෙසා මරණයට පත්වීම එක් වරක් පමණක් කරන දෙයක් නොවේ. දෙවියන් වහන්සේ මමත්වයට පත්විය යුතු කාරණා මුලින්ම පෙන්වන විට එය මමත්වයට මරණයට පත්වීමේ ආරම්භය විය හැකිය. නමුත් එය නිරන්තරයෙන් සිදුවන දෙයක් විය යුතුය. මක්නිසාද යේසුස් වහන්සේව අප තුළින් නිරන්තරයෙන් ප්‍රකාශ කළ හැකි වන්නේ එයින් පමණි. දවස මුළුල්ලේ තෝරා ගැනීමට දහසක් දේවල් අප ඉදිරියේ පවතිනු ඇත. එයින් අදහස් කරන්නේ සැලසුම් නැත. කාලය නැත, මුදල් නැත, අපගේම සතුටක් නැත. එය අප වටා සිටින අයට නිරන්තර යටහත්වීමක් අදහස් කරනු ඇත. මක්නිසාද දෙවියන් වහන්සේට අපගේ යටහත්කම මනිනු ලබන්නේ මිනිසාට අප තුළ ඇති යටහත්කම මගිනි. සෑම නින්දාවක්ම, උපහාසයක්ම, අපව බිඳ දැමීමේ දෙවියන් වහන්සේගේ මාර්ගය වනු ඇත. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය සඳහා අප තුළ තවමත් ගැඹුරු මාර්ගයක් ඇත.

ඔබට නොකඩවා දෙවියන් වහන්සේව සතුටු කිරීමට සහ ජයග්‍රාහී ජීවිතයක් ගත කිරීමට හැකි එකම ක්‍රමය උන්වහන්සේ අප තුළ ජීවත්වීම මිස අපේ ජීවිතය තුළ අප ජීවත්වීම නොවේ. අපි

2 පිටුවට

1 පිටුවෙන්

බලාපොරොත්තු බිඳවැටීම...

කොයිරම් උත්සාහකලත් අපේ ජීවිතය තුළ තිබෙන ආත්මාර්ථකාමී බව උන්වහන්සේගේ ජීවිතයට හාත්පසින්ම විරුද්ධ බැවින් අපගේ ජීවිතය යේසුස් වහන්සේගේ ජීවිතයෙන් පිරවීමට නම් නිරන්තරයෙන් අපි අපේම මමත්වයට මරණයට පත්විය යුතුය. ඒ සඳහා අපගේ සදාචාරාත්මක තෝරා ගැනීම්වලදී උන්වහන්සේ සමඟ සම්බන්ධතාවය ඇතිව සිටිය යුතුය.

කුසලාන උතුරා යයි

කෙසේ වෙතත් පිඹීදීමට ලක්වීම පිඹීදීමේ ආරම්භයයි. පිඹීදීමේදී ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී ඉතිරී යන අතර එය ජයග්‍රාහී ජීවිතයකි. අපි ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී සිටිනවාද කියා මේ මොහොතේ අපෙන් ඇසුවොත් "ඔව්" යනුවෙන් පිළිතුරුදීමට අපි කී දෙනෙක් නිර්භීතව සිටිනවාද .... ? පිඹීදීම යනු දවසේ ඕනෑම මොහොතක "ඔව්" යනුවෙන් පැවසීමට හැකිවීමයි. එසේ පැවසීම අහංකාර නොවේ. මක්නිසාද ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී ඉතිරීයාමට සැලැස්වීම නිශ්චිතවම සහ සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේගේ කාර්යයකි. ඒ සියල්ල උන්වහන්සේගේ කරුණාවයි. අපි කළ යුත්තේ අපගේ බිඳුණු හිස් භාජන උන්වහන්සේගෙන් පිරවීමට ඉඩ ලබාදීමයි. ඇන්ඩ්‍රෘ මරේ පවසන්නේ, ජලය සැමිටම පහත්ම ස්ථානය සොයමින් පුරවනවාසේම, දෙවියන් වහන්සේ, ඔබ පහත්ව, හිස්ව සිටින බව දුටු මොහොතේම උන්වහන්සේගේ බලය සහ මහිමය ගලාර්මට සලස්වන බවයි.

අපි බොහෝ දෙනාට බොහෝ දේවල් සරලව සහ පැහැදිලි කර ඇති චිත්‍රය නම් මනුෂ්‍යයාගේ සිත භාජනයක් (කුසලානයක්) ලෙස වන අතර අපි එය යේසුස් වහන්සේ වෙතට දිගු කරන විට උන්වහන්සේ එය උන්වහන්සේගේ ජීවන ජලයෙන් පිරවීමට ආශාවේ බලා සිටින බවයි. යේසුස් වහන්සේ ජීවන ජලය සහිත රන් වතුර භාජනයක් උසුලාගෙන සිටන බව නිරූපණය කර ඇති අතර උන්වහන්සේ අප පසුකර යන විට අපගේ කුසලානය දෙස බලන සේක. එය පිරිසිදු නම් උන්වහන්සේ එය ජීවන ජලයෙන් පුරවන සේක. යේසුස් වහන්සේ පසුකර යන සෑමවිටම අපගේ කුසලාන උතුරා යාමට සලස්වන සේක. "මාගේ කුසලාන උතුරා ගලයි." කියා දාවිත් පවසන්නේ එබැවිනි.

ඔබත් මමත්, මෙම පිඹීදීමෙන් උතුරා යාම තුළ අපටත් අනිත් අයටත් ඒ ආශිර්වාදය ගලා යයි. අපගේ හදවත් නිරන්තර සාමයෙන් පිරියනු ඇත. මනුෂ්‍යයන් සිතන්නේ තමකමට මරණයට පත්වීම දුක්ඛිත තත්ත්වයක් බවයි. නමුත් එය ඊට ප්‍රතිවිරුද්ධ දෙයකි. තමකමට මරණයට පත්වීම ප්‍රතික්ෂේප කිරීම තමාව දුක්ඛිත තත්ත්වයකට පත්කරනු ලබන්නෝය. අපි උන්වහන්සේ තුළ මරණය ගැන වැඩ වැඩියෙන් දැනගන්නා තරමට අපි උන්වහන්සේගේ ජීවනය වැඩි වැඩියෙන් දැනගන්නෙමු. එවිට සැබෑ සාමය සහ ප්‍රීතිය වර්ධනය වේ. උන්වහන්සේගේ ජීවනය ද අප තුලින් ගලායනු ඇත. පාපයේ ගැතිවී සිටින අයගේ ආත්ම ගැලවීම සඳහා සැබෑ ආශාවකින් සහ අනිත් කිතුණුවන්ගේ ආශිර්වාදය උදෙසා ගැඹුරු ආශාවකින් පූර්ණ වේ.

ලේ යටතේ පැවතීම

යේසුස් වහන්සේ අපව පසුකර යනවිට, අපගේ කුසලාන පිරවීම වළක්වන්නේ එක් දෙයක් පමණි. එනම් පාපයයි. ස්වාමීවූ යේසුස් වහන්සේ අපිරිසිදු භාජන පුරවන්නේ නැත. තමකමින් හටගන්න ඕනෑම දෙයක් එය කොයිතරම් කුඩා දෙයක් වුවත් එය පාපයකි. සේවය තමාගේම ශක්තිය හෝ තමා ගැනම තෘප්තියට පැමිණීම පාපයකි. සෝදිසි කිරීම් හෝ අසීරු අවස්ථාවලදී තමා ගැනම අනුකම්පාව ඇතිවීම, කිතුණු සේවයේ දී හෝ ව්‍යාපාරවලදී ආත්මාර්ථකාමීවීම තමා ගැනම සලකමින් විවේකීව සැපෙහි නියැලීම, තමා ගැනම සංවේදීවීම, අමනාපය නොරිස්සුම, තමාවම ආරක්ෂා කර ගැනීමට උත්සාහ දැරීම සිදුවන විට අනිත් අයව වේදනාවට පත්කිරීම හෝ තුවාල කිරීම සිදුවේ. තමා ගැනම සිතමින් පැත්තටවී සිටීම, වේදනාවීම, බයවීම තමකමින් පැණ නගින අතර මේ සියලුම දේ පාපය වේ. ඒවා අපගේ කුසලාන අපවිත්‍ර කරනු ලබයි. ස්වාමී වූ යේසුස් වහන්සේ ගෙත්සෙමන උයනේ දී වේදනාවට පත්ව සිටි නමුත් කල්වාරියේ දී උන්වහ්නසේ තිත්ත කාඩිය පානය කර අපගේ පාපයේ කුසලානය දරාගත් සේක. අපගේ කුසලානවල ඇති දේ උන්වහන්සේ පෙන්වා එය උන්වහන්සේට භාර දුන්නොත් පාපය උදෙසා තවමත් ගලායන්නා වූ අනර්ඝ වූ උන්වහන්සේගේ ලේ වලින් අපව පවිත්‍ර කරනු ලබනවා ඇත. එයින් අදහස් කරන්නේ පාපයේ දෝශයෙන් පවිත්‍ර කරනවා පමණක් නොව පාපයේ කැළැල් වලිනුත් අපව පවිත්‍ර කරන සේක යනුය. මේ කාරණා දෙකම සැබවින්ම ඉටුවන නිසා දෙවියන් වහන්සේට ස්තුති වේවා. අපගේ පාපය කුමක් වුවත් උන්වහන්සේ අපගේ කුසලානය පවිත්‍ර කරන සේක. එමෙන්ම උන්වහ්නසේගේ ශුද්ධාත්මයෙන් අපව උතුරායාමට සලස්වන සේක.

අබණ්ඩව පවතින පවිත්‍ර කිරීම.

ඒ වාගේම දවස්පතා අපට ඒ අනර්ඝ වූ ලේ වලින් ප්‍රයෝජන ලබාගත හැකිය. ඔබ යේසුස් වහ්නසේට ඔබගේ කුසලානය පිරිසිදු කිරීමට ඉඩ ලබා දී ඇති අතර එය පිරී ඉතිරී යන තෙක් උන්වහ්නසේව විශ්වාස කළ යුතුය. නමුත් ඊර්ෂ්‍යාව, කෝපය පැමිණි විට එයට ඉඩ හැරියොත් සිදුවන්නේ කුමක්ද .. ? ඔබගේ කුසලානය අපිරිසිදු වන අතර එය උතුරායාම නතර කරනු ලබයි. මේ ආකාරයෙන් අපි නිරන්තරයෙන් පරාජයට පත්වුවහොත් අපගේ කුසලානය කිසි විටෙකත් උතුරා පිටාර ගලන්නේ නැත.

නොකඩවා පිඹීදීම දැන ගැනීමට නම්, අපි කුසලානය පිරිසිදුව තබා ගැනීමට ඉගෙන ගත යුතුය. පිඹීදීම නතර කිරීම කිසි විටෙකත් දෙවියන් වහන්සේගේ කැමැත්ත නොවේ. ඉතිහාසය තුළ ඒ ඒ කාලවල පිඹීදීම පිළිබඳව අපි දනිමු. එසේ වූ විට සාතන් නිශ්චිතවම කුඩා කුඩා පාප අපගේ කුසලානවලට දැමීම එක් කාරණයකි. නමුත් අපි නැවත කල්වාරිය වෙත ගොස් පාපයේ ආරම්භයේ සිට මොහොතින් මොහොත පවිත්‍ර කිරීමට යේසුස් වහන්සේගේ ලේ වල බලය නැවත ඉගෙන ගන්නේ නම් නිරන්තරයෙන් උතුරායන කුසලානයේ රහස ඉගෙන ගෙන ඇත. ඊර්ෂ්‍යාව, විවේචනය, කේන්තියාම වැනි කුමන දෙයක් ස්පර්ශ වූ බව හැඟුණහොත් ඒ මොහොතේම උන්වහන්සේගේ ලේ වලින් පවිත්‍ර කරන ලෙස යේසුස් වහන්සේගෙන් ඉල්ලා සිටින්න. එවිට පාපිෂ්ඨ ප්‍රතික්‍රියාව පහව ගොස් ප්‍රීතිය සහ සාමය නැවත අළුත්වී ඔබගේ කුසලානය උතුරා යනවා ඔබට පෙනෙනු ඇත. මේ ආකාරයෙන් යේසුස් වහන්සේගේ ලේ විශ්වාස කරන තරමට පාපයේ ක්‍රියාව හීනවී යනු ඇත.

නමුත් පවිත්‍රවීම කළ හැකි වන්නේ අපි ප්‍රථමයෙන් දෙවියන් වහ්නසේ ඉදිරිපිට අදාළ කාරණය උදෙසා බිඳීමට ලක්වීමෙන් පමණි. කෙනෙකු තුළ තිබෙන ගති ලක්ෂණ නිසා අපට කෝපය ඇතිවන්නේ නම් අපගේ කෝපයේ ක්‍රියාව කල්වාරිය වෙත ගෙන යාම පමණක් ප්‍රමාණවත් නොවේ. අපි මුලින්ම බිඳී යා යුතුය. එනම් ඒ ප්‍රශ්නය ගැන අපි දෙවියන් වහන්සේට යටහත් විය යුතුය. එම අදාළ පුද්ගලයා සහ ඔවුන්ගේ මාර්ග අප උදෙසා දෙවියන් වහන්සේගේ කැමැත්ත ලෙස පිළිගත යුතුය. එවිට උන්වහන්සේගේ ලේ වලින් අපගේ පාපය පවිත්‍ර කරන බව දැන සිටීමින් අපගේ වැරදි ප්‍රතිචාරය යේසුස් වහන්සේ වෙතට ගෙන යාමට අපට හැකිවේ. අප පාපයෙන් පවිත්‍ර වූ පසු වැලපෙමින් සිටින්නේ නැතුව අපගේ ජයග්‍රාහී ස්වාමීන් වහන්සේ දෙස බලා සිටීමට හැකි වේ. උන්වහන්සේ මේ වන විටත් ජයග්‍රාහිකව සිටින නිසා උන්වහන්සේට ප්‍රශංසා වේවා.

දෙවියන් වහන්සේගේ සාමය පවත්වා ගැනීම

යේසුස් වහන්සේ සමඟ ගමන් කිරීම හැසිරවීමට සහ පාපය පැමිණ ඇති බව අවබෝධ කර ගැනීමට දේව වචනය ලබා දෙන මඟපෙන්වීම සරල නමුත් සියල්ල ඇතුළත් මගපෙන්වීමක්ව තිබේ. **"ක්‍රිස්තුස් වහන්සේගේ සමාදානය නුඹලාගේ සිත්වල ආණ්ඩුකෙරේවා. ඒ පිණිස නුඹලා එක ශරීරයක්ව සිටීමට කැඳවාගනු ලැබුවහුය. ස්තුතිවන්තවද සිටපල්ලා."** (කොලොස්සි 3:15) දෙවියන් වහන්සේගේ සාමයට බාධා කරන අපගේ හදවත් තුළ ඇති සියල්ල පාපයයි. එය කොයිරතම් සුළු හෝ කුඩා වුවත් ප්‍රථමයෙන් එය පෙනේනට පටන් ගනී. මෙම සාමය අපගේ හදවත්වල පාලනය හෝ අපගේ හදවත්වල තීරකයා වන්නේය. පාපන්දු තරඟයකදී විසිනුරුවරයා විසිල් එක නාද කළ විට තරඟය නවත්වන්නට සිදුවේ. වරදක් කර අපගේ සාමය නැති වූ විට විනිසුරුවරයාණන් වන දෙවියන් වහන්සේ වහාම නතරවන ලෙස සංඥා කරන සේක. අපගේ වරද පෙන්වා දෙන ලෙස දෙවියන් වහ්නසේගෙන් ඉල්ලා සිටින්න. ඇදහිල්ල කරුණුකොටගෙන උන්වහන්සේ පාපය ඇතිවනු ඇත. අපගේ කුසලාන උතුරා යමින් අපි ගමන් කරන්නෙමු. කෙසේ වෙතත් දෙවියන් වහන්සේ අපට උන්වහන්සේගේ සමාදානය ලබා නොදෙන්නේ නම් ඒ අපි සැබවින්ම බිඳීමට ලක්වී නොමැති නිසාය. සමහර විට අපිට දෙවියන් වහන්සේට මෙන් වෙනත් පුද්ගලයෙකුට සමාවෙන්න කියා කීමට බැරිව සිටිනවා විය හැකිය. එසේත් නැති නම් එය අනිත් කෙනොගේ වරදක් බව තවමත් අපට හැගෙනවා විය හැකිය. නමුත් අපේ සාමය නැති වී ඇත්නම් එය කාගේ වරක් ද යන්න පැහැදිලිය. වෙනත් කෙනෙකුගේ පාපයක් නිසා දෙවියන් වහන්සේ අපගේ සාමය නැති කරන්නේ නැත. නමුත් එසේ සිදුවන්නේ තමන්ගේම පාපය නිසා පමණි. දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ අපගේ ක්‍රියාවල ප්‍රතිඵලය අපට පෙන්වීමට වන අතර අප එය පවිත්‍ර කර ගැනීමට කැමති වන්නේ නම් පමණක් අපට උන්වහන්සේගේ සමාදානය ලැබෙනු ඇත.

වෙන කිසිවෙකු නොව දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන දෙවියන් වහන්සේගේ සමාදානයෙන් පාලනයවීමට සරල නමුත් එය කොයිතරම් සෙවිය යුතුද ..? අපි ගතකළා වූ ආත්මාර්ථකාමී ක්‍රියා මාර්ග දැන් අපට පෙන්වාදී ඇති අතර ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීමකින් තොරව අපට ඒවායේ ගමන් කළ නොහැකිය. මැසිවිලි නැගීම, නොසැලකිලිමිකම සහ කුඩාම දෙය දක්වා සියළුම පාප අනාවරණය වන්නේ අපි දෙවියන් වහන්සේගේ සමාදානයෙන් පාලනයවීමට සූදානම් වන විටය. දවසකදී බොහෝ වාරයක් සහ කුඩාම දේවලදීත් අපට යේසුස් වහ්නසේගේ ලේ වලින් පවිත්‍රවීමට සිදුව අතර, කලින් නොවූ ලෙස තැළුණු, බිදුණු මාවතේ ගමන් කිරීමටත් සිදුවනු ඇත. නමුත් එම තැළුණු බිදුණු බව තුළ යේසුස් වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය සහ කරුණාව ප්‍රකාශ කරන සේක.

පළමු පියවර තබන්න.

කෙසේ වෙතත් අප බොහෝදෙනා ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬ නොසලකා හැර තිබෙන නිසා ඒ හඬ ඇසීම නතර වී ඇත. අපි දවස් පසුකර යන අතර පවිත්‍රවීමේ අවශ්‍යතාවයක් නොමැතිව කැඩී බිඳීයාමට කාරණා ඇති බවක් ද හැගෙන්නේ නැත. එබැවින් අපි සිටින්නේ සාමාන්‍යයෙන් අපි සිතනවාට වඩා නරක තත්ත්වයකය. යේසුස් වහන්සේගේ ලේ වලින් අපි පවිත්‍ර කරගත යුතු මොනාවාදැයි අපට පෙන්වා දෙන ලෙස දෙවියන් වහන්සේ ඉදිරියේ හඬා වැලපීමට පෙර දෙවියන් වහන්සේ සමඟ බිඳී තිබෙන්නා වූ සම්බන්ධතාවය හරිගස්වා ගැනීමට විශාල පිපාසයක් අප තුළ තිබිය යුතුය. උන්වහන්සේ අපට පෙන්වා දෙන දෙය නම් අපගේ කීකරුකම සහ තැළුණු බිදුණු ස්වභාවයයි. පිඹීදීම සඳහා පළමු පියවර එයයි.

"යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේම ආශා වළකාගෙන දවස්පතා තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා." (ලුක් 9:23)

උන්වහන්සේ එනතුරු උන්වහන්සේව සොයන්න

රිව් කාර්මයිකල් විසිනි.

පෙරමඟ දූතයා 2023 ජනවාරි, පෙබරවාරි කලාපයේ හොෂයා 10:12 වන පදය මත පදනම වී වැන්ස් හැව්නර් විසින් ස්වාමීන් වහන්සේ සෙවීමට කාලයයි යන පණිවිඩය බෙදා ගැනීමෙන් අපි ආශිර්වාද ලැබුවෙමු. **"ධර්මිෂ්ඨකම පිණිස වපුරාගෙන, කරුණාවේ ඵලයට කපාගනිල්ලා පුරන්බිම කොටාගනිල්ලා, ස්වාමීන් වහන්සේ ඇවිත් නුඹලාට ධර්මිෂ්ඨකම වස්වන තුරු දැන් උන්වහන්සේ සොයන්නට කාලයයි."** (හොෂෙයා 10:12) පිඹීදීම සඳහා ස්වාමීන් වහන්සේව සෙවීමට බොහෝ පාඨකයන්ගේ හදවත් පුබුදු කිරීමට එම ලිපිය සහ එම කලාපයේ අනෙකුත් ලිපි භාවිතා කළ ආකාරය ගැන අපි දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන්නෙමු.

හොෂෙයා පවසන දේ අද දවස සඳහ කොයිතරම් වැදගත් ද යන්න සැලකිල්ලට ගනිමින් ස්වාමීන් වහන්සේ හොෂෙයාට භාර දුන් පණිවිඩයේ සමස්ත සන්දර්භය තුළ එය නැවත සලකා බැලීමට මම ඔබට ආරාධනා කරමි. ආත්මික, සදාචාරාත්මක හා දේශපාලනික වහයෙන් විශාල පරිහානියකට ලක් වූ කාලයක හොෂෙයා ඊශ්‍රායෙල් ජනතාවට අනාගතවක්තෘවරයෙක් විය. තත්ත්වයෙහි බරපතලකම සංඛේතවත් කිරීමට ස්වාමීන් වහන්සේ හොෂෙයාට වෛශ්‍ය භාර්යාවක් සහ වෛශ්‍යා දරුවන් අරගනින්නැයි කී සේක. **"හොෂෙයා ලවා ස්වාමීන් වහ්නසේ කියෙවූ කාරණාවල පටන් ගැන්මය. ස්වාමීන් වහන්සේ හොෂෙයාට කතාකොට, නුඹ ගොස් වෛශ්‍යා භාර්යාවක් ද, වෛශ්‍ය දරුවන් අරගනින්න. එක්නිසාද දේශය ස්වාමීන් වහන්සේගෙන් බොහෝ සේ වෛශ්‍යාකම්කෙරේයයි කී සේක."** (හොෂයා 1:2) දෙවියන් වහන්සේ තම සෙනගට මහා වෛශ්‍යාව හෝ මහා ගනිකාව ලෙස දොස්පවරනවාට වඩා බරපතල දෙයක් තිබෙනවාද .. ?

හොෂෙයා පොත කියවන විට එවැනි බරපතල චෝදනාවක් එල්ල කිරීමට හේතුව පැහැදිලි වේ. දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් සෙනගට ප්‍රේම කළත්, ඔවුන්ට අවශ්‍ය දේ සපයමින් ඔවුන් ගැන සැලකුවත් ඔවුන් උන්වහන්සේව අත්හැර වෙනත් දෙවිවරු පසුපස ගියෝය. **"ඈ ඇගේ මුදල, අභරණ ද පැළඳගෙන ඇගේ ප්‍රේමවන්තයන් පස්සේ ගොස්, මා සිහිනැතිකොට, ඈ විසින් සුවඳ දුම් බස්පු කරන්ට යෙදුණා වූ බාල්දේවතාවුන්ගේ දවස් නිසා ඇට දඹුවම් කරන්නෙමියි ස්වාමීන් වහන්සේ කියන සේක."** (හොෂෙයා 2 :13) සෙනඟ සියලු ආකාර පාපවල වරදකාරයන් විය. **"ඊශ්‍රායෙල් පුත්‍රයෙනි, ස්වාමීන් වහන්සේගේ වචනය අසාපල්ලා. එක්නිසාද සැබෑකමවත්, කරුණාවත්, දෙවියන් වහන්සේ ඇඳිනගැනීමවත් දේශයෙහි නැති හෙයින් දේශයේ වැසියන් සමඟ ස්වාමීන් වහ්නසේට පැවිණිල්ලක් තිබේ. දොස් තිබීම ද, බොරුකීමද, මිනීමැරීම ද, සොරකම් කිරීම ද, කාමමිත්‍යාචාරය ද විස වෙන කිසිවක් නැත. ලේ වැගිරීම පිට ලේ වැගිරීම වෙයි."** (හොෂෙයා 4:1-2) ඔවුහු බෝවෙන්ට, බෝවෙන්ට මට විරුද්ධව වඩ වඩා පව් කළෝය. ඔවුන්ගේ ගෞරවය ලැජ්ජාවට හරවන්නෙමි. (හොෂෙයා 4:7) නුඹලා දුෂ්ඨකම නැවහුය. අයුතුකම කපාගත්තහුය. බොරුවල ප්‍රතිඵල කවහුය. මක්නිසාද නුඹ නුඹේ මාර්ගයත්, නුඹේ බලවතුන් රාශියත් කෙරෙහි විශ්වාස කළෙහිය. (හොෂෙයා 10:13) ඔවුන් උඩඟුකමෙන් පූර්ණව දෙවියන් වහන්සේ වෙතින් ඈතට ගියෝය. ඔවුන්ගේ ගොදුරු බිම් ප්‍රකාරයට ඔවුහු තෘප්තියට පැමිණ්ණෝය. තෘප්තියට පැමිණි විට ඔවුන්ගේ සිත උඩඟු විය. එබැවින් ඔවුහු මා මතක නැති කළෝය. (හොෂෙයා 13:6)

දෙවියන් වහන්සේ තම සෙනගගේ තත්ත්වය විස්තර කිරීමට ආත්මික වෛශ්‍යාකමේ රූපය භාවිතා කිරීම පුදුමයක් නොවේ. හොෂෙයා පාවාගත්තාවූ වෛශ්‍යා ස්ත්‍රියගෙන් ලැබුණු දරුවන්ට තැබුවා වූ නම් වලින් එම පින්තූරය තවදුරටත් පෙන්වා දෙයි. පළමු පුත්‍රයා හැඳින්වූයේ "යෙස්‍රෙයෙල් " යනුවෙනි. එහි අර්ථය දෙවියන් වහන්සේ අවුස්සන සේක හෝ දෙවියන් වහන්සේ විසුරුවන සේක යනුයි. මෙම නමින් අදහස් කරනු ලැබුවේ, දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් සෙනඟව විනිශ්චය කිරීමට සැලසුම් කර ඇති බයි. (හොෂෙයා 1:4 දියණියක් වූ ඊළඟ දරුවාට "ලෝ රුහාමා" ලෙස නම් තබන්නැයි දෙවියන් වහන්සේ හොෂෙයාට පැවසූ සේක. එහි අර්ථය ප්‍රේම නොකරන සේක යනුයි. **"ඈ නැවත ගර්භනීව දුවෙකු වැසුවාය. ස්වාමීන් වහන්සේ ද ඈට ලෝ රුහාමා යන නම තබාපන්න. එක්නිසාද මම ඊශ්‍රායෙල් වංශයට කමාවන ලෙස ඔවුන්ට නැවත නවත් අනුකම්පා නොකරන්නෙමි."** (හොෂෙයා 1:6) තුන්වෙනි දරුවා වන පුත්‍රයාට "ලෝ අම්මි" යනුවෙන් නම් තැබීය. එහි අර්ථය "මාගේ සෙනඟ නොවේය." යනුයි. **"ස්වාමීන් වහන්සේ වෙසේ කී සේක. ඔහුට ලෝ අම්මි යන නම තබාපන්න. එක්නිසාද නුඹලා මාගේ සෙනඟ නොවේය. මමත් නුඹලාගේ දෙවයන් වහන්සේව නොසිටින්නෙමි."** (හොෂෙයා 1:9)

මෙම තත්ත්වය තීරණාත්මක වූයේ දෙවියන් වහන්සේ පාපය බැරැරුම් ලෙස සැලකුවත් උන්වහන්සේගේ සෙනඟ එය අවතක්සේරු කිරීමට නැඹුරුවී සිටිය **නිසාය.** **"ඔවුන්ගේ සියලු දුෂ්ඨකම් මට වතක තිබෙන බව ඔවුහු තමුන්ගේ සිත් වලින් කල්පනා නොකරති. දැන් වුහු තමුන්ගේ ක්‍රියාවලින් වටවී සිටිති. ඒවා මාගේ මුහුණ ඉදිරිපිට තිබේ."** (හොෂෙයා 7:2) **"ඔවුහු තමුන්ගේ බැටළුවන් සහ ගවයන් ද ඇතුව ස්වාමීන් වහන්සේ සොයන්නෝය. නුමුත් උන්වහ්නසේ ඔවුන්ට සම්බවන්නේ නැත. උන්වහන්සේ ඔවුන්ගෙන් පහව සිටින සේක."** (හොෂෙයා 5:6) එමෙන්ම විනිශ්චය ඔවුන් මත පවින බව හොෂෙයා දැඩි ලෙස අනතුරු අඟවන්නා වූ කාරණයයි.

ඒ අතරම මහත් බලාපොරොත්තුවක් තිබේ

දෙවියන් වහන්සේගේ සෙනඟ අතරේ යම් කාල වකාවනුවක යම් බලාපොරොත්තු රහිත තත්ත්වයක් පෙනුණේ නම් එය හොෂෙයාගේ කාලයේ දී පැවතුණි. ඒ අතරම හොෂෙයාගේ පණිවිඩය බලාපොරොත්තුව අවබෝධ කර ගැනීමට අවස්ථාවක් ලබා දෙන්නේය. හොෂෙයා පවසන්නා වූ දෙවියන් වහ්නසේගේ හදවතේ පණිවිඩයෙන් අනාවරණය කරනු ලබන්නේ උන්වහන්සේගේ විනිශ්චය අත්විඳීමට නොව නමුත් පසුතැවිලි වී ආත්මික ජීවිතය උතුරා පිටාර ගලන පිණිස දෙවියන් වහන්සේව සෙවීමයි. උදාහරණයක් වශයෙන් අපි අවධානය යොමු කරන්නා වූ පදයේ සඳහන් වන පුදුමාකාර ආරාධනාවා සහ බලාපොරොත්තුව සලකා බලන්න. **"ධර්මිෂ්ඨකම පිණිස වපුරාගෙන, කරුණාවේ ඵලයට කපාගනිල්ලා. පුරන්බිම කොටා ගනිල්ලා. ස්වාමීන් වහන්සේ ඇවිත් නුඹලාට ධර්මිෂ්ඨකම වස්වන තුරු දැන් උන්වහන්සේ සොයන්ට කාලයය".** (හොෂෙයා 10:12) අපි ධර්මිෂ්ඨකම වපුරන්නේ නම් අපි දයාවෙන් නෙළා ගන්නෙමු. අපි ස්වාමීන් වහන්සේව සොයමින් පුරන්බිම කොටගන්නේ නම් උන්වහන්සේ අප මත ධර්මිෂ්ඨකමේ වර්ෂාව එවන සේක. **"එබැවින් ස්වාමීන් වහ්සේ ඇඳිගනිවු. ඇඳිනගෙන්ට වීර්යය කරවු. උන්වහන්සේගේ උදාවීම පහන්වම මෙන් ඒකාන්තමය. උන්වහන්සේ වර්ෂාව මෙන්ද, පොළොව තෙමන අන්තිම වර්ෂාව මෙන්ද අප ළඟට එනවා ඇත."** (හොෂෙයා 6:3) දෙවියන් වහන්සේ පැමිණි විට පුද්ගලයන් තුළ සභාවන් තුළ ජන සමාජයන් තුළ ජාතීන් තුළ වුවත් පිඹීදීම ඉක්මනින් සහ අනපේක්ෂිත ලෙස සිදුවන බව අපි ඉතිහාසයේ පිඹීදීම් තුලින් දකින්නෙමු. ඊට හේතුව දෙවියන් වහන්සේ පැමිණි විට, උන්වහන්සේ බලය, ශුද්ධකම සත්‍යතාමය, වරද ඒත්තු ගැන්වීම, ගැලවීම, ජීවනය, ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය සහ තේජාන්විත කාරණා දිගින් දිගටම පවතින බව අපි දකින්නෙමු. අපගේ ජාතිය තුළ අපගේ සභාවන් තුළ ජන සමාජයන් තුළ හෝ අපගේ ජීවිතවල වුවත් පිඹීදීම ප්‍රමාද වැඩි යැයි අප සිතමට පුළුවන. නමුත් දෙවියන් වහ්නසේ පැමිණි විට ඕනෑම දෙයක් සිදු විය හැකිය.

දේවගැතිවරයෙකුගේ බිරිඳක් වූ එලිනෝර් මැකින්නි 1960 දශකයේ අගභාගයේ සහ 1970 දශකයේ මුල් භාගයේ දී ඇය අත්දුටුවා වූ පිඹීදීම පිළිබඳව "වසර හතළිහකට පසු උදය පිනි මෙන් තවමත් නැවුම්" යන මාතෘකාව යටතේ පෙරමඟ දූතයා පත්තරයට ලියන ද ලිපියක් මට හමු විය. ඇය මෙසේ ලියා තිබුණි. අවුරුදු හතළිහක් පුරාවට නොමැකෙන හැඟීමක් ඉතිරි කරමින් ඊයේ සිදුවූවාක් මේ විස්තර රඳවා තබා ගනිමින් පුද්ගලයෙකුගේ හදවත ආකර්ෂණය කරගත හැකි සිදුවීම කුමක්ද .. ? දෙවින් වහන්සේ ස්වර්ගයේ සිට වගුරන ලද ශුද්ධ වූ බලය ඔබ කවදා හෝ අත්විඳ ඇත්නම් ඔබ ඔබගේ ජීවිතය කිසිදාක ඒ හා සමාන දෙයක් සිදුවූයේ නැතැයි ඔබගේ පිළිතුරවනු ඇත.

අපගේ දවස්වලදී ස්වාමීන් වහන්සේගේ අභිමුඛත්වයේ සහ බලයේ එබඳු වැගිරීමක් සඳහා අපි ආශා කරන්නේ නැද්ද ... ? යෙසායා අනාගතවක්තෘ මෙන් අපටත් පැවසිය නොහැකිද ... ? **"අහෝ, ඔබගේ එදිරිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද, ඔබ ඉදිරියෙහි ජාතීන් වෙවුලවන පිණිසද, ඔබවහන්සේ අහස පලාගෙන බසින්ටත්, ගින්න කැලෑව දල්වන්නාක් මෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් මෙන්ද, ඔබ ඉදිරියෙන් කඳු දියවයන්නටත්, යෙදුනොත් හොඳය."** (යෙසායා 64:1-2) එය අපගේ ආශාව නම් හොෂෙයා 12:10 වන පදයේ අනාවරණය කරන්නේ අප පසුතැවිලිවී පුරන්බිම කොටා ගැනීම පමණක් නොව ස්වාමීන් වහන්සේ පැමිණ අප මත ධර්මිෂ්ඨකම වස්වන තුරු උන්වහන්සේව සෙවිය යතු බවයි. "තෙක් " යන කුඩා වචනයක් පිඹීදීම සඳහා අත්‍යාවශ්‍යය (ඉතා වැදගත්) වන්නේය.

හොෂෙයාගේ දවස්වලදී මෙන්ම අද දවසේදීත් දුක්ඛිත ආත්මික සදාචාරාත්මක, දේශපාලනික තත්ත්වයක් තිබියදීත් ස්වාමීන් වහන්සේගේ හදවතේ ඇති කාරණය නම් අපි පුරන්බිම කොටාගෙන ධර්මිෂ්ඨකම උදෙසා වපුරා දයාවෙන් නෙලාගන්න පිණිස උන්වහන්සේ ඇවිත් ධර්මිෂ්ඨකම වස්වන තුරු උන්වහන්සේව සෙවීමයි. එය කොයිරතම් දිරිගන්වන දෙයක්ද ... ? මෙය උන්වහන්සේ අපට කරන කැඳවීමයි. පසුතැවිලිවීමට අපව යොමු කරන්නේ උන්වහන්සේගේ කරුණාවයි. (රෝම 2:4-5) ප්‍රශ්නය නම් උන්වහන්සේගේ ආරාධනාව අපේ සිතට ගන්නාවද යන්නයි.

ඇස්බර් විශ්වවිද්‍යාලයේ ඇති වූ පිඹීදීම.

ඇස්බර් විශ්වවිද්‍යාලයේ මෑතකදී අත්දුටු පිඹීදීම හෝ ආත්ම වැගිරීම වෙනුවෙන් අපට කොයිරතම් කෘතඥවිය හැකිද .. ? පෙබරවාරි මාසයේ රැස්වීම පැවති දින 16 තුළ විශ්ව විද්‍යාලයේ සිසුන්ටත්, පිටතින් පැමිණි අයටත්, එක්සත් ජනපදයේ සහ වෙනත් රටවලින් පැමිණි දහස් ගණනකටත් බලපෑමක් ඇති කළේය. ස්වාමීන් වහන්සේ අනෙකුත් විශ්ව විද්‍යාලවල ඇවිළුණු ගිණිදැල් මහා පරිමාණයෙන් අවුලවමින් පිඹීදීම ඇති කිරීමට කරුණාවන්ත වූ සේක.

"ඔබගේ සෙනඟ ඔබ කෙරෙහි ප්‍රීතිමත් වන පිණිස අප නැවත ජීවත් නොකරනසේක්ද ... ? ස්වාමීනී, ඔබගේ කරුණාව අපට දැක්වුව මැනව. ඔබගේ ගැලවීම අපට දුන මැනව. දෙවි වූ ස්වාමීන් වහන්සේ කුමක් කියන සේක්දැයි අසන්නෙමි. එක්නිසාද උන්වහන්සේ ස්වකීය සෙනගටත් ශුද්ධවන්තයන්ටත් සමාදානය වදාරණ සේක. නමුත් ඔවුහු අඥානකමට නැවත නොහැරෙත්වා. තේජස අපේ දේශයේ වසන පිණිස සැබවින්ම උන්වහන්සේගේ ගැලවීම උන්වහන්සේට බයවෙන්නන් සමීපයෙහිය." (ගීතාවලිය 85:6-9)

"අප ප්‍රේමය දැනගෙන සිටින්නේ ඒ තැනැත්වහන්සේ තමන් ප්‍රාණය අප උදෙසා දුන් හෙයිනි්ය. " (1 යොහාන් 3:16)

යටහත් වූ කැමැත්තක බලය

(ආර්.ඒ. ටෝරි විසිනි.) (1856-1928)

"දෙවියන් වහන්සේ එක් වරක් කී සේක. මම මෙය දෙවරක් ඇසීමි. එනම් බලය දෙවියන් වහන්සේට අයිති බවත්, ස්වාමීනී. කරුණාවත් ඔබට අයිති බවත්ය. මක්නිසාද ඔබ එක එක මනුෂ්‍යයාට ක්‍රියාවේ හැටියට ප්‍රතිඵල දෙන සේක." (ගීතාවලිය 62:11-12) නුමුත් එම බලය අපට ලබාදීමට එක් කොන්දේසියක් පනවා ඇත. එනම් සම්පූර්ණයෙන්ම උන්වහන්සේට යටහත්වීමයි.

"නුඹලාගේ අවයවයන් අධර්මිෂ්ඨකමේ ආයුධකොට පාපයට භාර නොදී නුඹලාට මළවුන්ගෙන් ජීවත්ව සිටිනන්නන් වෙන් දෙවියන් වහන්සේට භාරවී නුඹලාගේ අවයවයන් ධර්මිෂ්ඨකමේ ආයුධකොට උන්වහන්සේට බාරදීපල්ලා." (රෝම 6:13)

අපි නැවතත් වෙසේ කියවන්නෙමු. "නුමුත් දැන් නුඹලා පාපයෙන් නිදහස් කරන ලදුව, දෙවියන් වහන්සේගේ දාසයෝවී, ශුද්ධකම සඳහා වල ඵලන්නහුය එහි කෙළවර සදාකාල ජීවනයය. " (රෝම 6:22)

ආශිර්වාදයේ සහ බලයේ මහත් රහස මෙම පදවල දකින්නට ලැබේ. ඔබගේ ජීවිතය දෙවියන් වහන්සේට යටත් කරන්න. සම්පූර්ණ රහස එම වචනවලින් සොයාගත හැකිය. දෙවියන් වහන්සේගේ පාලනය යටතේ ඔබගේ ජීවිතය තැබීම එම සිතුවිල්ලයි. වෙනත් වචන වලින් කියනවා නම් සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේට යටත් වෙන්න. දෙවියන් වහන්සේගේ වස්තුව ලෙස උන්වහන්සේට කැමති දේ ඔබ තුළ කිරීමට උන්වහන්සේට කැමති ආකාරයට ඔබව පාවිච්චි කිරීමට ඉඩ දෙන්න.

දෙවියන් වහන්සේ මා වෙනුවෙන් තබා ඇති සියල්ල දැන ගැනීමට මම කැමති නම්, මම කළ යුතු දේ කුමක්ද කියා යම් කෙනෙක් ඇසුවොත් පිළිතුර ඉතා සරලය. දෙවියන් වහන්සේට සම්පූර්ණයෙන්ම යටත් වෙන්න. උන්වහන්සේට මෙනෙස පවසන්න. ස්වර්ගීය පියාණෙනි. මෙතැන් සිට මම මගේම කැමැත්තක් නැත. ඔබගේ කැමැත්ත මා තුළ ද, මා තුලින් ද , මා විසින් ද, මා සම්බන්ධනේ ද සෑම දෙයකදීම සිදුවේවා. මාගේ ජීවිතය සම්පූර්ණයෙන්ම ඔබවහන්සේගේම හස්තට භාරදෙමි. ඔබවහන්සේට කැමති දේ මා තුළ කළමනාව යම් කෙනෙක් එසේ කරන විට අසීමිත ප්‍රේමයක්, අසීමිත ප්‍රඥාවක් අසීමිත බලයක් ඇති දෙවියන් වහන්සේ ඒ තැනැත්තා සමඟම හොඳම දේ කරයි.

යටහත් වූ කැමැත්ත සත්‍යය පිළිබඳ දැනුම රැගෙන එයි.

දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීමෙන් සත්‍ය පිළිබඳ දැනුම ගෙන එනු ලබයි. **"යමෙක් උන්වහන්සේගේ කැමැත්ත කරන්ට කැමති නම් ඔහු ඒ ඉගැන්වීම දෙවියන් වහන්සේගෙන් වූ ඉගැන්වීමක් ද, නොහොත් මා විසින් උපදවා කියනවාදැයි දැනගන්නේය."** (යොහාන් 7:17) දෙවියන් වහ්සේගේ කැමැත්තට යටත්වීම මෙන් වෙන කිසිවක් අධ්‍යාත්මික දර්ශනය පැහැදිලි නොකරයි. **"අප විසින් උන්වහන්සේගෙන් අසා නිබෙන්නා වූ නුඹලාට දන්වන්නා වූ පණිවිඩය නම්, දෙවීන් වහන්සේ ආලෝකය බවත්, උන්වහන්සේ තුළ කිසිම අන්ධාකරයක් නැති බවත්ය."** (1 යොහාන් 1:5) දෙවියන් වහන්සේට යටත්වීමෙන් ආලෝකය වන උන්වහන්සේම වෙත අපගේ දෑස් විවෘත කරනු ලබයි. එය අපව එක්වරම සියලු සත්‍ය සමඟ එකඟතාවයට ගෙන එයි.

තමාගේම කැමැත්ත හෝ පාපය මෙන් ආත්මික දර්ශනය අන්ධකරන වෙන කිසිවක් නැත. වසර ගණානවක් තිස්සේ මුෂ්‍යයන්ට වද දුන් ප්‍රශ්න ඔවුන් දෙවියන් වහන්සේට භාර දුන් විට ඉතා කෙටිකාලයක් තුළ විසඳා ඇති බව මම දුටුවෙමි. කලින් දවසේ රාත්‍රිය මෙන් අඳුරුව තිබුණු දෙවල් දවාල මෙන් ආලෝක වී ඇත. "ශරීරයේ පහන නම් ඇසය. එහෙයින් නුඹේ ඇස පැහැදැලි නම් නුඹේ මුළු ශරීරය ද එළිය වන්නේ. නුඹේ ඇස නපුරු නම්, නුඹේ මුළු ශරීරය අඳුරු වන්නේය. එබැවින් නුඹ තුළ තිබෙන එළිය අඳුරු නම්, ඒ අඳුර කොපමණ මහත්ද .. ? (මතෙව් 6:22-23)

කැමැත්ත සහ ජීවිතය යටත් කිරීම ආලෝකයේ සහ දැනුමේ රහසයි.

යටත් වූ කැමැත්ත යාච්ඤා කිරීමට බලය ලබාදෙයි.

ජීවිතය සහ කැමැත්ත යටත් කිරීමේ ඵළඟ ප්‍රතිඵලය වන්නේ යාච්ඤාව තුළ බලයයි. යාච්ඤාවේ පවතින ලොකුම රහස එයයි. යොහාන් තුමා ඔහුගේ ප්‍රීතිය දනවන අත්දැකීම මෙලෙස සඳහන් කරනු ලබයි. **"නවද අපි උන්වහන්සේගේ ආඥා රක්ෂා කරමින් උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්න දේ කරන බැවින් අපි උන්වහන්සේගෙන් ඉල්ලන සියල්ල ලබමුව."** (1 යොහාන් 3:22) අපි කුමක් ඉල්ලුවත් අපට උන්වහන්සේගෙන් එය ලැබේ යන එම අපූරු වදන් සැලකිල්ලට ගන්න. ඒ ගැන සිතන්න. සොයන දේ ලබා ගැනීමට අපොහොසත් වන්නේ යාඤ්ඤාව කුඩා හෝ විශාල නිසා නොවේ. ඊට හේතුව සැලකිල්ලට ගන්න. අපි උන්වහන්සේගේ ආඥා රක්ෂා කරමින්, උන්වහන්සේ ඉදිරියේ ප්‍රසන්න දේ කරන බැවින් දෙවියන් වහන්සේගේ වචනයේ අනාවරණය කර ඇති පරිදි උන්වහන්සේගේ කැමැත්ත කිරීමට සම්පූර්ණයෙන්ම යටත් වූ ජීවිතයක් සහ උන්වහන්සේ ඉදිරියේ ප්‍රසන්න දේ කිරීමට සම්පූර්ණයෙන්ම අවනතවීම යාච්ඤාව තුළ පවතින රහසයි.

ඔබ ඉල්ලන දේ ඔබට නොලැබෙන්නේ මන්දැයි ඔබ අසනවාද ...? මම ඉල්ලන ඕනෑම දෙයක් මට ලැබෙනවා යැයි යොහාන් තුමා මෙන් ඔබට පැවසිය නොහැක්කේ ඇයි ... ? ඒ ඔහු අපෝස්තුළුවරයෙකු නිසාත්, ඔබ එදිනෙදා සාමාන්‍යය කිතුණුවෙක් නිසාත් නොවේ. ඒ මම උන්වහන්සේගේ ආඥා පිළිපදින්නෙමි. උන්වහන්සේ ඉදිරියේ ප්‍රසන්න දේ පමණක් කරන්නෙමියි ඔහුට පවසන්නට හැකි වූ බැවිනි. එමෙන්ම ඔබට එසේ කියන්නට බැරි ඔහු සම්පූර්ණයෙන්ම ඔහුගේ ජීවිතය භාර දී තිබූ නිසාත්, ඔබ ඔබගේ ජීවිතය එසේ කර නැති නිසාත්ය. අපි දෙවියන් වහන්සේගේ කැමැත්ත අපේ කරගත් විට උන්වහන්සේ අපේ කැමැත්ත උන්වහන්සේගේ කරගනු ලබන සේක. **"ස්වාමීන් කෙරෙහි ප්‍රීතිවත් වෙව, උන්වහන්සේ ද තාගේ සිතෙහි ආශාවන් ඉෂ්ඨකරගන සේක."** (ගීතාවලිය 37:4)

යේසුස් වහන්සේ, පියාණන් වහන්සේට මෙසේ පැවසූ සේක. **"ඔබ නිතරම මාගේ වචන අසන බව දැනගෙන සිටියෙමි. නුවුත් මා එසේ කීවේ ඔබ විසින් මා එවූ බව අවට සිටින්නා වූ සමූහයා විශ්වාස කරන පිණිස ඔවුන් නිසායයි කී සේක."** (යොහාන් 11:42) උන්වහන්සේ, දෙවියන් වහන්සේගේ ඒකජාතික පුත්‍රයා නිසා එසේ සිදුවූවා යැයි ඔබ කියන්නෙ ඇයි ..? එය කිසිසේත්ම එසේ නොවේ. නමුත් යේසුස් වහන්සේට මෙලෙස පැවසීමට හැකි වූ සේක. "මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනැත්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය." (යොහාන් 6:38) නැවතත් උන්වහන්සේ පවසා තිබුණේ මෙසේය. **"යේසුස් වහන්සේ ද මාගේ කෑව නම් මා එවූ තැනැත්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ඨ කිරීමය. "** (යොහාන් 4:34) **"එවිට මම කනාකොට, දෙවීන් වහන්ස මෙන්න පොත් කාණ්ඩයේ මා ගැන ලියා නිබෙන ලෙස ඔබගේ කැමැත්ත කරන්ට ඇවිනි සිටිමියි කී සේක."** (බෙබ්‍රෙව් 10:7)

යාච්ඤාවේ පවතින මහත් වූ රහස යටත් වූ ජීවිතක් සහ යටත් කැමැත්තයි. ජෝර්ජ් මුලර් යාච්ඤාවෙන් බෙහෝ දෙවල් කළ කෙනෙක් ලෙස අනිත් අය අතරේ කැපී පෙණුනි. මක්නිසාද වසර ගණනාවකට පෙර ඔහු දෙවියන් වහන්සේට අවශ්‍ය දේ කිරීමට සහ එය සම්පූර්ණ කිරීමට උන්වහන්සේගේ කැමැත්ත දැනගන්නා පිණිස දිනපතා තමාගේ ජීවිතය ගැඹුරින් දෙවියන් වහන්සේගේ වචනය මෙනෙහි කිරීමට යොමු කළ බැවිනි. ඔහු දෙවියන් වහන්සේට යටත් විය. අපිත් ඒ දේම කලොත් දෙවියන් වහන්සේගේ කුමාරයෙක් වීමට අප අතරේ සිටන කිසිවෙකුට අවහිරකමක් නැත.

යටත් වූ කැමැත්ත ප්‍රීතියේ පූර්ණත්වය ගෙන එයි.

යටත් වූ කැමැත්තක ඵළඟ ප්‍රතිඵලය වන්නේ ප්‍රීතිය උතුරා යන සිතකි. යේසුස් වහන්සේ මුහුණදීමට යන දරුණු වේදනාත්මක තත්ත්වය උන්වහන්සේ සිය ගෝලයන්ට මෙසේ වදාළ සේක. **"මම මාගේ පියාණන් වහන්සේ ආඥා රක්ෂාකොට උන්වහන්සේගේ ප්‍රේමයෙහි යම් සේ පවතිමි ද, එසේම නුඹලාත් මාගේ ආඥා රක්ෂා කරව් නම් මාගේ ප්‍රේමයෙහි පවතින්නාහුය. මාගේ ප්‍රීතිය නුඹලා තුලෙහි පවතින පිණිසද, නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණ ව පිණිසද මේ දේවල් නුඹලාට කීවෙමි."** (යොහාන් 15 : 10-11) යේසුස් වහන්සේ තම පියාණන් වහන්සේගේ ආඥා රක්ෂා කිරීමෙන් උන්වහන්සේගේ කැමැත්තට සම්පූර්ණයෙන් යටත්වීමෙන් ප්‍රීතිය සොයාගෙන ඇති අතර ගෝලයෝද එම මාර්ගයෙහිම ගමන් කරන්නෝ නම් උන්වහන්සේගේ ප්‍රේමය ඔවුන් තුළ පවතිනු ඇත. එමෙන්ම ඔවුන්ගේ ප්‍රීතිය සම්පූර්ණ වේ. ප්‍රීතියේ පූර්ණත්වය සොයා ගැනීමට එකම මාර්ගය මෙයයි. කොන්දේසි විරහිතව දෙවියන් වහන්සේට යටත් වෙන්න. සම්පූර්ණයෙන්ම යටත් නොවුණු හදවතක් ඇති කිතුනණු ජීවිතයක ප්‍රීතියේ පූර්ණත්වය නොමැත.

තමන් කිතුණුවන් යැයි කියාගන්නා බොහෝ දෙනෙකුට කිතුදහම දුක්ඛිත තත්ත්වයක් ලෙස පෙනේ. ඔවුන්ට තවදුරටත් ලෝකයේ දේවල් තුළ ප්‍රීතියට පත්විය නොහැකි අතර ඔවුන් දෙවියන් වහන්සේගේ ප්‍රීතියට ද ඇතුළත්ව නැත. මිසරයේ ලීක්ස්, ළූණු, සුදුළුනු අහිමිවී සිටින අතර කානන් දේහයේ කිරි, මීපැණි අනර්ඝ වූ තිරිඟු නැතිව එහි සිටගෙන

5 පිටුවට

"අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත්වෙන පිණිස උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන් ඉසුලූ සේක." (1 ප්‍රේත්‍රුස් 2:24)

යටහත් වූ කැමැත්තක බලය...

4 පිටුවෙන්

සිටිති. එය දුක්ඛිත තත්ත්වයකි. එයින් මිදීමේ මාර්ගය සරලය. දෙවියන් වහන්සේට සම්පූර්ණයෙන්ම යටත් වෙන්න. එවිට ඔබ ප්‍රීතියෙන් පූර්ණවනු ඇත. මෙම ප්‍රීතියේ පූර්ණත්වයට ඇතුළු වූ බොහෝ දෙනෙක් මම දනිමි. සමහරවිට මහත් පොර බැඳීමකින් එය ලබාගෙන ඇත. ඔවුන් සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේට යටත් වී බියෙන් යුතුව දෙවියන් වහන්ස ...., ඔබ කැමති දේ මා තුළ කළ මැනව කියා අයැද සිටියෝය. සමහර විට මහත් අමාරු දෙයක් පවසනු ඇතැයි බියවූහ. චීනය, ඉන්දියාව, අප්‍රිකාව වෙනුවෙන් උන්වහන්සේ යමක් පවසනු ඇතැයි කියාත් සමහර විට ලෝකයට මහා පරිත්‍යාගයක් ලෙස පෙනෙන දේ, ආදරණීය අභිලාෂයන් අත්හැරීම ආදරය කරන අය අත්හැරීම, බොහෝ මුදල් සමහර විට සියලුම දේ අත්හැරීමට වුවත් පැවසීමට හකිය. ඒ කුමන ස්වභාවයේදී වුවත් ප්‍රීතියෙන් පූර්ණවනු ඇත.

එම ප්‍රීතියේ පූර්ණත්වය සොයා ගැනීමට ඇත්තේ එක් මාර්ගයක් පමණි. එනම් යටත් වූ ජීවිතයකි. කැමැත්ත සහ ජීවිතය දෙවියන් වහන්සේට සම්පූර්ණයෙන්ම යටත් කළ විට සියලුම තත්ත්වයන් මධ්‍යයේ ප්‍රීතිය ගෙන එනු ඇත. පුරාණ කාලයේ දී මෙසේ දෙවියන් වහන්සේට යටත් වූ කෙනෙකුට කණුවක ගැට ගසා පුළුස්සා දැමීමට ගෙන යනු ලැබූ අතර ඔහු තම දැතින් කණුව බදාගෙන ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය සාදයෙන් පිළිගනිමු. සදාකාල ජීවනය සාදරයෙන් පිළිගනිමු යනුවෙන් ගැගැසුවේය.

යටත් වූ කැමැත්ත ක්‍රිස්තුස් වහන්සේව අප වෙතට රැගෙන එයි

යටත් වූ ජීවිතයකට ඊළඟ ප්‍රතිඵලය නම් ක්‍රිස්තුස් වහන්සේව අපට ප්‍රකාශ කිරීමයි. යේසුස් වහන්සේව පාවා දුන් රාත්‍රියේ දී උන්වහන්සේ තම ගෝලයන්ට මෙසේ වදාළ සේක. **"යමෙක් මාගේ ආඥා පිළිගෙන rක්ෂා කෙරේද එට ප්‍රේම කrන්නේ ඛහුය. එට ප්‍රේම කrන්නා මාගේ පියාණන් විසින් ප්‍රේමකrනු ලබන්නේය. එම ද ඛහුට ප්‍රේමකොට ඛහුට ප්‍රකාශවන්නෙවියි කී සේක."** (යොහාන් 14:21) අපගේ ජීවිත ක්‍රිස්තුස් වහන්සේට යටත් කිරීම උන්වහන්සේව අපගේ ජීවිතවලට ගෙන එනු ලබයි. ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණ ප්‍රකාශවීම සිදුවන්නේ අනාගතයේදීය. එය සත්‍යයකි. **"එක්නිසාද ස්වාමීන් වහන්සේව එහත් ශබ්දයක් ද. උත්තම දේවදූතයෙකුගේ හඬද. දෙවියන් වහන්සේගේ හොrණෑ නාදය ද ඇතුව ස්වර්ගයෙන් බස්නා ඒක. ක්‍රිස්තුස් වහන්සේ තුළ මළා වූ අය පළමුකොට නැඟිටින්නෝය."** (1 තෙසලෝනික 4:16) නමුත් පියාණන් වහන්සේ සහ පුත්‍රයාණන් වහන්සේ අප වෙතට පැමිණ වාසය කරන විට දැන් (වර්තමානයේදී) උන්වහන්සේව අපට ප්‍රකාශ වේ. (යොහාන් 14:23)

යේසුස් වහන්සේ, උන්වහන්සේව අපට ප්‍රකාශ කරනු ඇත. සමහර අය පවසන්නේ ඔබ උන්වහන්සේට යටත්වී තිබේද ... ? උන්වහන්සේගේ ආඥා සියල්ල රක්ෂාකරනවාද ..? එසේ නම් උන්වහන්සේව ඔබට ප්‍රකාශ කිරීම යනු සම්පූර්ණ ප්‍රීතිය ලබා දී ඇති බව හඳුනාගෙන ඇත යනුයි. දේව වචනයේ මෙලෙසින් සඳහන් වේ. **"උන්වහන්සේ මෙසේ කියා තමන්ගේ අත්ද. ඇඳුය ද ඔවුන්ට දැක්වූ සේක. එවිට ගෝලයෝ ස්වාමීන් වහන්සේ දැක සන්තෝෂ වූහ."** (යොහාන් 20:20) ඔබ උන්වහන්සේව දකින විට ප්‍රීතිය ඇතිවන්නේය. ඔබ උන්වහන්සේව දකින විට උන්වහන්සේ වෙතට ගොස් මම මගේ ජීවිතය ඔබවහන්සේට සම්පූර්ණයෙන්ම යටත්කර දෙමි. මම මගේ ජීවිතයෙන් ඔබවහන්සේව දකින්නට සලස්වන්නෙමි කියා පවසන්න.

යටත් වූ කැමැත්ත ශුද්ධාත්මයාණන් වහන්සේව අප වෙතට ගෙන එයි

අවසාන වශයෙන් යටත් වූ ජීවිතයක් සහ කැමැත්තක් ඇති විට එහි තවත් ප්‍රතිඵලයක් වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේව ලැබීමේ මහා රහසයි. ප්‍රේත්‍රුස් මෙලෙස පැවසුවේය. **"අපි වේ කාrණාවලට සාක්ෂිකාrයෝය. එසේම දෙවියන් වහන්සේ විසින් තමන්ට කීකrු වෙන්නන්ට දුන් ශුද්ධාත්මයාණන් වහන්සේත් සාක්ෂිකාrයෙකුයි කීවෝය."** (ක්‍රියා 5:32) ඒ සියල්ල සිදුවන්නේ යටත්වීම මය. අපට එක එක පාප පිළිබඳව කටයුතු කළ හැකිය. ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණවීම සඳහා දෙවියන් වහන්සේට කන්නලව් කළ හැකිය. නමුත් අපගේ පැවැත්ම මධ්‍යයේ සම්පූර්ණ යටත්වීමක් නොමැති නම්, අපි දෙවියන් වහන්සේට යටත් නොවන්නේ නම් එයින් කිසිවක් සිදු නොවනු ඇත. ශුද්ධාත්මයාණන් වහන්සේට තමන් කෙරෙහි පැමිණෙන ලෙස බොහෝ දෙනෙක් යාච්ඤා කර කඳුළු සැලුවත් උන්වහන්සේ නොපැමිණියේ නම් ඊට හේතුව ඔවුන් සම්පූර්ණ යටත්වීමක් නොවීම නිසාය. ජීවිතය යටත් නොකිරීමේ ප්‍රතිඵලය එයයි.

ඉන්පසුව, ඔවුන් දෙවියන් වහන්සේට යටත්වී මුහුණින් වැටී. අනේ දෙවියන් වහන්ස, මම ඔබවහන්සේට යටත් වෙමි. සම්පූර්ණයෙන්ම ඔබවහන්සේට භාරවෙමි. මම කිසිවකින් පසු නොබසිමි කියා පැවසුවෝය. ශුද්ධාත්මයාණන් වහන්සේ එබඳු අය මතට වගුරවනු ලබන සේක. සමහර විට එම බලය සහ ප්‍රීතිය විශාල රැළි සමඟ විය හැකිය. සමහර විට ඔවුන්ගේ මුළු ජීවිතයම සොරාගත් මෘදු සන්සුන් හඬකින්, සමහර විට කුඩා හඬකින් එය පැමිණිය හැකිය.

උන්වහන්සේ පැමිණි ක්‍රමය කුමක් වුවත් උන්වහන්සේ පැමිණෙන සේක. උන්වහන්සේ පැමිණි විට බලය ලැබෙන්නේය. දෙවියන් වහන්සේගේ බලයේ මහත් වූ රහස නම් අපි අපගේ ජීවිත සහ කැමැත්ත යටත් කරන විට අප කෙරෙහි ශුද්ධාත්මයාණන් වහන්සේගේ පැමිණීමය. (ක්‍රියා 1:8) ශුද්ධාත්මයාණන් වහන්සේ අප වෙතට පැමිණීමේ මහත් වූ රහස යටත් වූ කැමැත්ත සහ යටත් වූ ජීවිතයකි. ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කොපමණ ආශ්චර්යයක්ද .. ? කොයිතරම් ආශිර්වාදයක් ද .. ? කොයිතරම් තේජාන්විතද .. ?

ඔබට එය ලැබේවිද .. ? මළවුන් සහ ජීවතුන් අතරේ සිටින අය මේ උන්වහන්සේට යටත් වෙන්න. ඔබගේ අවයවයන් දෙවියන් වහන්සේට ධර්මිෂ්ඨකමේ උපකරණ මෙන් බාරදෙන්න. දැන් ඔබ එය ඉටුකරනවාද .. ? ඔබ යටත් වෙනවාද ... ? දෙවියන් වන්නසේට යට් නොවන අය යටත්වීමට පසුබට වෙන අය කොයිතරම් අඥානද .. ? ජීවිතය සැබවින්ම වටිනා ජීවිතයක් කරන සදාකාලික බවින් හා ප්‍රීතියෙන් අලංකාර සහ තේජවත් කරවන සියල්ල ඔබ විසින්ම අහිමි කරගනු ලබයි. අද දවසේ ඔබගේ කැමැත්ත යටත් කර දෙනවාද .. ?

මහත් ජලාශය

(චාර්ල්ස එච්. ස්පර්ජන් විසිනි.) (1834-1892)

"සියල්ලටම වඩා නුඹේ සිත ආrක්ෂා කr ගනින්න. එක්නිසාද එයින් ජීවනය නික්මෙන්නේය." (හිතෝපදේශ 4:23) දැන් ස්වාමීන් වහන්සේට ප්‍රේම කරන ඔබ මට ඔබව ඔබගේ හදවතේ ජලාශය වෙතට ගෙනයාමට ඉඩදෙන්න. ඔබගේ ජීවිතයේ ප්‍රීතිය ගලායාමට සහ අනිත් අයට එය ප්‍රයෝජනවත්වීමට ඔබගේ හදවත නිවැරදිව තබා ගැනීමේ මහත් වූ අවශ්‍යතාවය සඳහා ඔබව දිරිගැන්වීමට මට ඉඩදෙන්න.

ඔබගේ සිත පූර්ණව තබාගන්න

පළමුව හදවත පූර්ණව තබා ගැනීමේ අවශ්‍යතාවය ඉගෙනගන්න. මෙම ප්‍රශ්න ඔබගෙන්ම ඇසිය යුතුව තිබේ. මම මගේ හදවත පූර්ණව තබාගන්නේ කෙසේද .. ? මගේ හැගීම් ශක්තිමත්ව තබාගන්නේ කෙසේද .. ? මාගේ ආශාවන් දැල්වෙන සහ මාගේ ජ්වලිතකම දීප්තිමත්ව තබාගන්නේ කෙසේද .. ? කිතුණුවනි මේ සියල්ල පැහැදිලි කරන එක් බයිබල් පදයක් තිබේ. **"....මාගේ උල්පත් සියල්ල නී තුලෙහි යයි කියන්නෝය. "** (ගීතාවලිය 87:7) යනුවෙන් දාවිත් පැවසුවේය. ඔබගේ සියලු උල්පත් දෙවියන් වහ්නසේ තුළ තිබේ නම් ඔබගේ හදවත පූර්ණවීමට එය ප්‍රමාණවත් වේ. ඔබ කල්වාරියේ පාමුලට ගියොත් ඔබගේ හදවත ප්‍රේමයෙන් සහ කෘතඥතාවෙයන් නැහැවේවි. ඔබ නිතරම මෙනෙහි කිරීමට සහ එහිදී දෙවියන් වහන්සේ සමඟ කථා කිරීමට යොමු වෙනවා නම් ඔබගේ සිත නිශ්චල අධිෂ්ඨානයෙන් පිරී යනු ඇත. ඔබ ඔබගේ ස්වාමීන් වහන්සේ සමඟ ඔලිව් කන්දට ගොස් උන්වහන්සේ සමඟ නපුරු යෙරුලසලම දෙස බලා උන්වහන්සේ සමඟ හඬමින් කඳුළු සලන්නේ නම් එවිට ඔබගේ හදවත තවමත් මරණයට පත්ව තිබෙන ආත්ම කෙරෙහි පෝමයෙන් පිරියනු ඇත.

නොකඩවා ඔබගේ පෙළඹවීම, ඔබගේ ජීවිතය ඔබගේ මුළු පැවැත්ම ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ලබාගත යුතුය. උන්වහන්සේ නොමැතිව ඔබට කිසිවක් කළ නොහැකිය. එමෙන්ම ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමඟ සමීප ඇසුරකින් ජීවත් වන්නේන් ඔබට වියලි හදවතක් අති බවට බියක් ඇති නොවේ. යාච්ඤාවෙන් තොරව ජීවත්වන්නා වූ කුඩා යාච්ඤාවකින් ජීවත්වන්නා වූ, කලාතුරකින් වචනය කියවන්නා වූ කලාතුරකින් ඉහළ සිට නැවුම් බලාපොරොත්තුවක් සඳහා ස්වර්ගය දෙස බලන්නා වූ තැනැත්තාගේ හදවත වියලි සහ වද බවට පත්ව තිබේ. නමුත් රහසින් තම දෙවියන් වහන්සේට යාච්ඤා කරන්නා වූ නිශ්චලව ශුද්ධ වූ මෙනෙහි කිරීමේ කාලයක් ගත කරන්නා වූ මහෝත්තම දෙවියන් වහ්නසේගේ වචනය මෙනෙහි කිරීමට කැමති තැනැත්තා ඔහුගේ ආත්මය ක්‍රිස්තුස් වහන්සේට භාරදී ඇත. උන්වහන්සේගේ පූර්ණත්වය ගැන සතුටුවන උන්වහන්සේගේ මුළු කරුණාව

6 පිටුවට

5 පිටුවෙන්

මහත් ජලාශය...

ගැන ප්‍රීතිවෙන, උන්වහන්සේගේ දෙවන පැමිණීම ගැන යාච්ඤා කරන උන්වහන්සේගේ මහිමාන්විත නැව පැමිණීම ගැන සිතමින් ප්‍රීතිවෙන මනුෂ්‍යයෙකුට උතුරා යන හදවතක් තිබිය යුතුය. ඔහුගේ හදවත මෙන් ඔහුගේ ජීවිතය එබඳු වනු ඇත. එය සම්පූර්ණ ජීවිතයක් වේ.

"ඔබගේ සිත ආරක්ෂා කරගන්න." එය පූර්ණව තබා ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේට කන්නලව් කරන්න. මන්ද එසේ නොවුවහොත් ඔබගේ ජීවිතයේ කාරණා දුර්වල, නොගැඹුරු, මතුපිටින් පෙනෙන ඒවා වන්නේය.

ඔබගේ සිත පිරිසිදුව තබාගන්න

කිතුණුවනි, ඔබගේ සිත පවිත්‍රව තබාගන්න. එය කරන්නේ කෙසේද කියා ඔබ ඇසිය හැකිය. ඊශ්‍රායෙල් සෙනඟ මිසරයෙන් නික්මයාමේ ගමනේදී බොන්නට වතුර නැතිව පිපාසයට පත්විය. ඔවුන් පැමිණියේ "මාරා" නැමති ස්ථානටයි. එහි තිබූ උල්පතින් වතුර බීමට ඔවුන් සැරසුණි. ඔවුන්ගේ දිව පන්දම් මෙන් දැල්වෙමින් තිබුණ ද, ඔවුන්ගේ මුඛය වහල මෙන් රත් වී තිබුණ ද, එහි වතුර තිත්තව තිබුණු නිසා බීමට නොහැකි විය.

දෙවියන් වහන්සෙ මෝසෙස්ට නියම කළ පිළියම ඔබට මතකද .. ? ඔහු එක්තරා ගසක් ගෙන වතුරට හෙළු විට වතුර මිහිරි සහ පැහැදිලි විය. උන්වහන්සේ අපට නියමකරන පිළියම් ද එයයි. (නික්මයාම 15:25)

ඔබගේ සිත (මනුෂ්‍යයාගේ සිත) සාපය නිසා ස්වභාවිකවම මාරාහී වතුර මෙන් තිත්ත සහ අපිරිසිදුව තිබේ. නිශ්චිත ගසක් ඇත. ඔබ එහි නම දැන සිටින්නේය. ගැලවුම්කරුවාණන්ව එල්ලා ඇති ගස, එනම් කුරුස ගස ඔබගේ සිත තුළට දමන්න. ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන එය ඉක්මනින් මිහිරි සහ පැහැදිලි බවට පත්වේ. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිත පවිත්‍රකරන සේක. උන්වහන්සේ අපව විශුද්ධ කරන සේක. (1 කොරින්ති 1:30)

එළිෂා වතුරට ලුණු දැම්මේය. (2 රාජාවලිය 2:21) නමුත් අපි යේසුස් වහන්සේගේ ලේ අපගේ සිත නැමති උල්පතට දැමිය යුතුය. අපි යේසුස් වහන්සේව දැනගෙන උන්වහන්සේට ප්‍රේම කරන්නෙමු. කුරුසිය අපගේ දැඩි භක්තිය සහ ප්‍රීතියේ තේමාව බවට පත්වේවා. එහිදී හදවත පවිත්‍ර කර බබලවන අතර ජීවිතය නොකැලැල් වන්නේය. හදවත මත කුරුසිය තබා ගැනමේ රහස අපි සියලුදෙනාම ඉගෙන ගන්නෙමු. කිතුණුවනි, ඔබගේ ගැලවුම්කරුවාණන්ට වඩ වඩා ප්‍රේමකරන්න. යේසුස් වහන්සේ කෙරෙහි වැඩි සෙනෙහසක් ඇතිවන පිණිස ශුද්ධාත්මයාණන් වහන්සේට මොරගසන්න. එවිට ඔබගේ පාපය කොයිතරම් ලාභදායි වුවත් ඔබට මෙලෙස පැවසිය හැකිය. මම දැන් උන්වහන්සේගේ නාමය දරා සිටින්නේ ප්‍රේමය නිසාය. මට අහිමි වූ දේ ගණන් කිරීමෙන් මට ලැබුණා වූ ලාභය කුමක්ද ? මගේ කලින් තිබුණා වූ ආඩම්භරය මාගේ ලැජ්ජාව ලෙස සලකමි. උන්වහන්සේගේ කුරුසියට ඇණ ගසනු ලැබීම ඔබගේ තේජස ලෙස සලකමි. සිත තුළ කුරුසිය තබා ගැනීමෙන් ආත්මය පවිත්‍ර කරනු ලබයි. එය මනස විනිශ්චය කර පිරිසිදු කරනු ලබයි. කිතුණුවනි ඔබගේ සිත පිරිසිදුව තබාගන්න. මක්නිසාද එයින් ජීවනය නික්මෙන්නේය.

ඔබගේ හදවත සන්සුන්ව තබාගන්න.

දැන් ඔබගේ හදවත නිවැරදිව තබාගන්න. ඔබගේ සිතට ඔබට ක්ෂණික දැඩි බලපෑමක් ඇති කිරීමට ඉඩ නොදෙන්න. දාවිත් ගැන ශුද්ධාත්මයාණන් වහන්සේ පැවසුවේ දාවිත්ගේ සිත ඔහුට දොස් පැවරූ බවයි. (2 සාමුවෙල් 24:10) යහපත් මනුෂ්‍යයෙකුට අතින් පහරදීමටත් වඩා හදවතට පහරදීම වේදනාකාරීය. එම පහර දැනිය හැකිය. එය ආත්මට යකඩයක් ඇතුල්වන්නාක් මෙන්ය. ඔබගේ සිත යහපත් සන්සුන්කමකින් තබාගන්න. ඔබගේ සියලු අවබෝධයන් ඉක්මවා යන දෙවියන් වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස් වහන්සේ කරුණුකොටගෙන ඔබගේ සිතේ සහ මනසේ තබා ගැනීමට උත්සාහ කරන්න. රාත්‍රියේ දණින් වැටී සම්පූර්ණ ලෙස පසුතැවිලිවී ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඔබගේ ඇදහිල්ල ප්‍රකාශ කරන්න. උදෑසන අවදිවී ඔබගේ හදවත දෙවියන් වහන්සේට දෙන්න. සම්පූර්ණ ප්‍රේමයෙන් සහ ශුද්ධ වූ ඇදහිල්ලේ මිහිරි දේවදූතයන් එහි තබන්න. එවිට ඔබට ලෝකය වෙතට යා හැකිය. එහි සිංහයන් සහ කොටියන්ගෙන් පිරී තිබෙන්නේ නම් තවදුරටත් ඔබට බියවීමට අවශ්‍ය නැත. දානියෙල්ව සිංහගුහාවට හෙළුවිට එය ඔහුට වඩා යහපතක් ගෙන දුන්නේය. ඔහු වටා සිටි සියල්ලන් ඒ තුලින් දෙවියන් වහන්සේව දැනගත්තෝය. ඔබගේ හදවත සන්සුන්ව තබාගන්න. එවිට ජීවිතය සතුටින් පිරී පවතිනු ඇත.

ඔබගේ ජීවිතය එලෙස වන පිණිස ඔබගේ සිත සන්සුන්ව තබාගන්න. මක්නිසාද ජීවනයේ කාරණා හදවතින් නික්මේ. මෙය සිදු කළ යුත්තේ කෙසේද .. ? අපි නැවතත් දෙන්නා වූ පිළිතුර නම් අපගේ හදවත සන්සුන් කරන පිණිස ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් අයැද සිටන්න. ගලීල මුහුදේදී කුණාටුව නිශ්චලවීමට අණකල හඬට හැර වෙනත් දෙයකට කුණාටු සහිත හදවක් නිශ්චල කළ නොහැකිය. තද කුණාටුව නිරන්තරයෙන් නිශ්චල කිරීමට මනුෂ්‍යය ස්වභාවය තුළ ශක්තියක් නැත. බලවත් ලෙස උන්වහන්සේට මොරගසන්න. උන්වහන්සේ තවමත් සහාව නැමති ඔරුව තුළ නිදා සිටින සේක. ඔබේ භක්තිය නොසන්සුන්තාවයේ ජලයෙන් විනාශ නොවන පරිදි අවදිවන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඔබගේ හදවතට සාමය හා සතුට ලබාදෙන ලෙස උන්වහන්සේට මොරගසන්න. එවිට ඔබගේ ජීවිතය සමාදානයෙන් පූර්ණ වනු ඇත.

නොබෙදුණු හදවතක්

දැන් මනුෂ්‍යයාගේ හදවතේ ඇත්තේ එක් කාරණයක් සම්පූර්ණයෙන්ම හඹා යාමට ප්‍රමාණවත් ජීවයක් පමණි. ඔබ ඔබගේ ප්‍රේමයෙන් අඩක් ක්‍රිස්තුස් වහන්සේටත්, අනිත් භාගය ලෝකයටත් නොදිය යුතුය. කිසි මනුෂ්‍යයෙකුට දෙවියන් වහන්සේටත්, වස්තුවටත් යන දෙකටම සේවය කළ නොහැකිය. මක්නිසාද ඒ දෙකටම සේවය කිරීමට ප්‍රමාණවත් ජීවක් හදවතේ නොමැති බැවිනි. බොහෝ දෙනා මේ දෙකම කිරීමට උත්සාහ කිරීමෙන් අසාර්ථකව සිටති. බීමත්ව සිටින මනුෂ්‍යයෙක් හැර වෙනත් අයෙක් පාරේ දෙපැත්තටම වැනි වැනි ඇවිදයනවා මම නුදුටිමි. බීමත්ව සිටින මනුෂ්‍යයා එසේ නොකිරීමට උත්සාහ කරති. එය සැබවින්ම අපහසු කාර්යයකි. නමුත් සදාචාරමය දෘෂ්ඨි කෝණයකින් බැලූ විට බොහෝ දෙනා පාර දෙපැත්තේම ඇවිදීමට උත්සාහ කරන බව මම දැක ඇත්තෙමි. ඔවුන් තුළ යම් ආකාරයක මත්වීමක් ඇති බව මට සිතුණි. එසේ නොමැති නම්, ඔවුන් එය ඉතා මෝඩ දෙයක් ලෙස අත්හැර දමා ඇත.

දැන් මම මේ ලෝකය සහ එහි සැප සම්පත් සෙවීම වටිනවා යැයි සිතුවොත් මම ඒවා සොයා ඒවා පසුපස ගමන් කරන්නෙමි. නමුත් ක්‍රිස්තුස් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ නම්, දෙවියන් වහන්සේ දෙවියන් වහන්සේ නම් අපි අපගේ මුළු හදවත් උන්වහන්සේට භාරදෙමු. අපගේ හදවත ලෝකය සමඟ පංගුකාරත්වයට යොමු නොකරමු. ඔබගේ ස්වාමියා ඔබ වෙනුවෙන් සම්පූර්ණයෙන්ම කැපවූ සේක. ඔබගේ ජීවිතය සීමා රහිතව උන්වහන්සේට භාරදෙන්න. ඔබගේ හදවතේ සෑම ක්‍රියාවක්ම සම්පූර්ණව උන්වහන්සේට යටත් කර දෙන්න. එකම වස්තුවක් සහ එකම අරමුණක් ඇතිව සිටීමට ශ්‍රමය යොමු කරන්න. මෙම අරමුණ සඳහා ඔබගේ හදවත දෙවියන් වහන්සේට දෙන්න. තවදුරටත් ශුද්ධාත්මයාණන් වහන්සේගේ දිව්‍යමය බලපෑම උදෙසා මොරගසන්න. ඔබගේ ආත්මය උන්වහන්සේ කරුණුකොටගෙන ආරක්ෂා කරන විට එක අරමුණක් උදෙසා යොමු විය හැකිය. එමෙන්ම ඔබගේ ජීවිතය ගැඹුරු පවිත්‍ර, පැහැදිලි ලෙස සහ සමාදානයෙන් ඉදිරියට ගෙන යනු ඇත. එහි රදා පවතින එකම දේ දෙවියන් වහන්සේගේ කැමැත්තයි. එකම අරමුණ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය සහ උන්වහන්සේව සතුටු කිරීමට ඇති ආශාවයි.

පිරී ඉතිරී යන ජීවිතය සහ ප්‍රේමය

කිතුණුවනි, ඔබගේ හදවත පොහොසත් දේවලින් පිරී තබා ගැනීමට මෙය ඔබ ඉගෙන ගත යුතුය. කිසිවිටෙකත් දේව වචනය නොසලකා හරින්න එපා. එය ඔබගේ සිත දේව නියෝගයෙන් සහ දැනගැන්මෙන් පොහොසත් කරයි. ඊළඟට ඔබ කථා කරන විට එය ඔබගේ මුඛයෙන් ගලා එයි. ඔබගේ සිත මෙන් ඔබගේ වචන ද අප්‍රසන්න හෝ ව්‍යාජ නොවී ආශිර්වාදයක් ගෙන දෙන්නෝය. ඔබගේ හදවත ත්‍යාගශීලී බවින් පොහොසත් වන විට ඔබගේ දැත් වලින් එම ත්‍යාගශීලී ස්වභාවය ගලායනු ඇත.

සියල්ලට වඩා ඔබගේ සිත තුළ යේසුස් වහන්සේට වාසය කිරීමට ඉඩදෙන්න. එවිට ඔබගේ ඇතුලාන්තයේ සිට ජීවමාන ගංගා ගලායයි. එය යාකොබ් පානය කළ ෂිබාර් ළිඳේ ජලයට වඩා පොහොසත් තෘප්තියක් ගෙන දෙන්නේය. මහත් වූ උල්පත වෙත ගොස් ඔබගේ හදවත ගැලවීම තුළ පොහොසත් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට මොරගසන්න. එසේ වූ විට ඔබගේ ජීවිතය සහ ඔබ අනිත අය සමඟ ඇති සම්බන්ධතාවය ඔවුන්ට ආශිර්වාදයක් වනු ඇත.

සියල්ලට වඩා ඔබගේ සිත තුළ යේසුස් වහන්සේට වාසය කිරීමට ඉඩදෙන්න. එවිට ඔබගේ ඇතුලාන්තයේ සිට ජීවමාන ගංගා ගලා යයි. එය යාකොබ් පානය කළ ෂිබාර් ළිඳේ ජලයට වඩා පොහොසත් තෘප්තියක් ගෙන දෙන්නේය. මහත් වූ උල්පත වෙත ගොස් ඔබගේ හදවත ගැලවීම තුළ පොහොසත් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට මොරගසන්න. එස් වූ විට ඔබගේ ජීවිතය සහ ඔබ අනිත් අය සමඟ ඇති සම්බන්ධතාවය ඔවුන්ට ආහිර්වාදයක් වනු ඇත. ඔවුන් ඔබව සහ ඔබගේ මුහුණ දකින විට දෙවියන් වහන්සේගේ දූතයෙක් මෙන් දකිනු ඇත.

"..... ඒ වනාහී තේජසේ බලාපොරොත්තුව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේය. , (කොලොස්සි 1:27)

පිඹිදීම පාපය ඒත්තු ගැන්වීම ගෙන දෙයි

(ඩබ්ලිූ. මෝරේ විලියම්) (1890-1980)

ශුද්ධ වූ දෙවියන් වහන්සේගේ බලවත් දර්ශනයක් අපි ලබා තිබුණත්, උන්වහන්සේ වෙතට දිව යන ප්‍රමාණය දැඩි උන්නදුවක් ඇතිව තිබුණත්, එය හොඳින් වටහාගෙන තිබුණත් අප සියලුදොනටම අවශ්‍යය කරන්නා වූ තරවටු කිරීමට සහ හික්මවීමට අප බියව සිටිනවාද ... ? ස්වාමීන් වහන්සේගේ තවත් බලවත් වටිනා පෙන්තකොස්ත දිනයක් අප මත වැගිරවීම සඳහා අප තරවටුවට හා හික්මවීමට හසුවීමට කැමතිද ... ?

සභාවේ හිස වශයෙන් යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක. **"මම නුඹේ ක්‍රියා දනිමි. නුඹ ශීතලව හෝ උෂ්ණව හෝ නොසිටින බවද දනිමි. නුඹ ශීතලව හෝ උෂ්ණව සිටිනවාට කැමැත්තෙමි. නුඹ උෂ්ණව හෝ ශීතලව නොසිට අඑම්වැරී සිටින බැවින් මාගේ මුඛයෙන් නුඹ වමාරන්නෙමි. කාලකණ්ණියාද, දුක්ඛිතයාද, දිළිඳුන්දාද, අන්ධයා ද, නග්නව සිටින්නා ද, නුඹම බව නුඹ නොදැන, මම ධනවත්ය, මට ධනය ඇත්තේය. කිසි දෙයකින් හිඟයක් නැතැයි නුඹ කියන බැවින්, නුඹ ධනවත් වන පිණිස ගින්නේ පවිත්‍ර කරන ලද රන්ද, නුඹේ නග්නභාවයේ ලැජ්ජාව ප්‍රකාශ නොවන පිණිස හැඳගන්ට සුදු වස්ත්‍ර ද, නුඹේ ඇස් පෙනෙන පිණිස ඇස්වල ගාගන්ට අඳුන් ද මාගෙන් ලබාගන්ට නුඹට අවවාද කරමි. මම පෙම්වකරන සියල්ලන්ට තරවටුකොට දඬුවම් කරමි. එබැවින් නුඹ ජවලිතව සිටි පශ්චාත්තාපයෙන්න."** (එළිදරව් 3:15-19)

මීට වසර ගණනාවකට පෙර පෙරමඟ දූතයා කාර්යාලයේ දේවගෘහයේ දේව මෙහෙයකට පැමිණි ලේක සුභාරංචි ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථානයෙන් පැමිණි සමහර මිෂනාරිවරුන් පැවසූ දේවලින් අපට මහත් ආශිර්වාදයක් විය. ඔවුන් එවකට බෙල්ජියන් කොංගෝවේ පැවති පිඹිදීම පිළිබඳව සහ අප්‍රිකාවේ මනුෂ්‍යන්ගේ හදවත් තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ බලවත් ලෙස ක්‍රියා කරමින් සිටින අයුරු පිළිබඳව අපට වාර්තාවක් ලබා දුන්නේය.

බිදුණු බව සහ විවෘතභාවය

එම පිඹිදීමේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ කිතුණුවන් සහ ගැලවීම නොලැබූ අය යන කොටස් දෙක තුළම පාපයේ මහත් භයංකාරබව වැටහී තිබීමයි. යේසුස් වහන්සේ පැවසූ ලෙස සැනසිලිදායක ආත්මයාණන් වහන්සේ පැමිණි කළ ලෝකයට පාපය හගවා දෙන සේක. (යොහාන් 16:7-8) මෙම වචන ඒ ජනතාව අතර බලවත් ලෙස ඉටු විය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්යයේ කැපී පෙනෙන අනෙක් ලක්ෂණ නම් ජීවිතයේ ශුද්ධකම, යාච්ඤා කිරීමේ ගැඹුරු ආත්මයක්, අනික් කිතුණුවන්ට ඇති ආදරය සැබෑ සහ ගැඹුරු නිහතමානිකම, වරද පිළිගෙන පසුතැවිලිවීම, ක්‍රිස්තුස් වහන්සේ තුළ නැවත ගොඩ නැගීම, මහත් වූ ප්‍රීතිය පිටතට ගොස් ස්වාමීන් වහන්සේ තමන්ගේ ජීවිතවල කළ මහත් දේ අන් අය සමඟ බෙදා ගනිමින් සාක්ෂි දැරීමට මහත් ආශාව ඇතිව සිටීම වේ.

මේ එය ඉටුවීමයි.

බෙල්ජියන් කොංගෝ ඇතුලු අප්‍රිකාවේ ඇති වූ මෙම පිඹිදීම ගැන මිෂනාරිවරුන් වාර්තා කරන පරිදි මේ එය ඉටුවීමයි යන පොතෙන් අදහස් කිහිපයක් අපි මෙහි දක්වන්නෙමු. ස්වාමීන් වහන්සේ හදිස්සියේම උන්වහන්සේගේ මාළිගවාට පැමිණ ඇත. (මලාකි 3:1-6) අප්‍රිකාවේ සභාවන් තුළ ද එය ඉටුවීය. ප්‍රථමයෙන් සී.ටී. ස්ටුඩ් සහ ඒ.බී.බක්ස්ටන් වසර ගණනාවක්ට ප්‍රථම ආරම්භ කරන ලද විෂනාරි මධ්‍යස්ථානයේ සේවය කරුණු කොටගෙන ශුද්ධාත්මයාණන් වහන්සේ බලවත් ලෙස ක්‍රියා කළ සේක. සෙනඟ සහ මිෂනාරිවරුන් බොහෝ කාලයක් පිඹිදීම උදෙසා යාච්ඤා කළෝය. නමුත් පිඹිදීම ඔවුන් මත හදිස්සියේම පිරී ඉතිරී යන විට එය ග්‍රහණය කරගන්නේ කෙසේදැයි ඔවුන් දැන සිටියේ නැත. මෙවැනි ආත්මික සුළි කුණාටුවක් ඔවුන් අපේක්ෂා කළේ නැත. කෙසේ වෙතත් දේශයේ වැසියන් සහ මිෂනාරිවරුන් යන සියලුදෙනා අතර බලවත් කාර්යයේ ඵල දැකීමටත්. සැබෑ සහ ව්‍යාජ දේ හඳුනාගැනීමටත් දෙවියන් වහන්සේ ඔවුන්ට කරුණාව ලබා දුන් සේක.

"බොහෝ අනාගතවකතාවෝ ලෝකයට පැමිණි වෙයල්ලා. ඔවුහු බැටළු වේශයෙන් නුඹලා ළඟට එති. නමුත් ඇතුළතින් ඔවුහු කෘරවූ වෘකයෝය. ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් අඳුනගත්තාහුය. මනුෂ්‍යයෝ කටුගස්වලින් මුදිකා ඵලවත්, ගොකටුවලින් අත්තික්කා ඵලවත් නෙලා ගනිද්ද ... ? එසේම සියලු හොඳ ගස් හොඳ ඵල දරයි. නමුත් නරක ගහ නරක ඵල දරයි. හොඳ ගහක නරක ඵලවත්, නරක ගහක හොඳ ඵලවත් හටගන්නට බැරිය. හොඳ ඵල නොදරන සියලු ගස් කපනු ලැබ ගින්නෙහි දවනු ලැබේද .. ? එබැවින් ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් අඳුනගන්නහුය." (මතෙව් 7:15-20) චාර්ල්ස් ජී. ෆිනීගේ සේවය යටතේ දෙවියන් වහන්සේ ලබා දුන් පිඹිදීම තුළ සමහර අවස්ථාවලදී පාපයේ බිහිසුණුකම අවබෝධ කර ගැනීම නිසා මනුෂ්‍යයන් තම ආසන වලින් බිම ඇද වැටුණි. බෙල්ජියන් කොංගෝ හිදී ඇති වූ පිඹිදීම තුළදී ද මේ හා සමාන දර්ශන දැකගත හැකි විය. පාපය භයානක දෙයකි. පිළිකුල් සහගත දෙයකි. වරක් ශුද්ධාත්මයාණන් වහන්සේ උන්වහන්සේගේ දැල්වෙන පහනේ ආලෝකය ඒ මත දැමූ සේක.

එක් මිෂනාරිවරියෙක් මෙසේ ලිවීය. මම වේල්සයේ පිඹිදීම පිළිබඳව ආර්.ඒ. ජෝන්ස් විසින් ලියනලද "ස්වර්ගය විවරවිය" නැමති පොත කියවමින් සිටියෙමි. ඔහු එහං සඳහන් කරන්නේ ශුද්ධවන්තයන්ගේ නමස්කාරයේ ශබ්දය නිසා ඉවැන්ජලිස්තවරයාට තම කටහඬ ඇසීමට තරම්වත් පුළුවන් නොවීය. අපි මෙහිදී දැකපු රැස්වීම් වලදී ඒක කොයිරතම් සැබෑවක්ව තිබණා ද ... ? අපි කවුරුවත් මීට කලින් මෙසේ දැක තිබුණේ නැත. ආත්මයාණන් වහන්සේ බලයෙන් අප කෙරෙහි පහළ වූ විට මම වේල්සස් ස්වන්සි බයිබල් විද්‍යාලයේ අපූරු යාච්ඤා රැස්වීම් රාශියකට සහභාගිවී සිටියෙමි. මෙම තත්ත්වය හැර වෙන කිසිවක් නුදුටුවෙමි.

තවත් මිෂනාරිවරයෙක් පැවසුවේ ස්වාමීන් වහන්සේ කරුණාවේ හා කන්නලව් කිරීමේ ආත්මය ඔවුන් කෙරෙහි වැගිරෙවූ ආකාරයයි. (සෙකරියා 10:12 ඉතා මහත් මැදහත්කාරකමක් ගලා ආවේය. මම පිරිමි ළමයින්ගෙන් ඉල්ලා සිටියේ ඔවුන්ගේ හදවත් විවෘත කරන ලෙසය. සිත් දැඩිකර නොගෙන කැඩෙන්න, බිදෙන්න කියා කීවෙමි. මට වැඩිදුරක් යාමට නොහැකි විය. මම කැඩී බිඳී හඬා වැටුණෙමි. මගේ බරවූ හදවතින්, වේදනාවෙන් යුක්තව එලෙස කදුළු සැලූ දවසක් මම නොදැන සිටියෙමි. කුඩා පිරිමි ළමයින් ද කැඩී බිඳීමට ලක්ව හඬා වැටුණේය. ඔවුන් සිටගෙන සිටියෝය. නැති නම් බිම වැතිර සිටියෝය. හඬා වැලෙපමින් ඔවුන්ගේ හදවත් දෙවියන් වහන්සේ ඉදිරියෙහි වගුරුවනු ලැබුවෝය.

"අහෝ ඔබගේ ඉදිරිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද, ඔබ ඉදිරියෙහි ජාතීන් වෙවුලවන පිණිසද, ඔබවහන්සේ අහස පළාගෙන බසින්ටත්, ගින්න කැළෑව දල්වන්නාක්මෙන්ද, ගින්න වතුර උතුරවන්නාක්මෙන්ද ඔබ ඉදිරියෙන් කඳු දියවයන්ටත් යෙදුණෙන් හොඳය." (යෙසායා 64:1-2) සෑම කිතුණුවෙක්ම එක්ම ස්වාමීන් වහන්සේ අප අතරට පැමිණ පාපය ඒත්තු ගැන්වීමෙන් ජාතීන් වෙව්ලවන පිණිස උන්වහන්සේගේ පැමිණීම ප්‍රකාශ කරන තෙක් උන්වහන්සේව සොයමු.

යාච්ඤාව සාමාන්‍ය මිනිසුන් බලය ඇති මිනිසුන් බවට පත්කරනු ලබයි. එය බලය ගෙන දෙයි. එය ගින්න ගෙන එයි. එය වර්ෂාව ගෙන එයි. එය ජීවනය ගෙන එයි. එය දෙවියන් වහන්සේව ගෙන එයි. (සැමුවෙල් ඩැක්විත්)

පසුගිය කලාපයෙන්

දෙවියන් වහන්සේ ප්‍රකාශවන විට පිඹිදීම ඇති වේ.

එමෙන්ම, **"අපි සියල්ලෝම කොළයක් මෙන් පරවෙමුව."** ගසක කොළයක් කහපාට සහ දුඹුරුපාට වන විට එයමැලවී වැටී යයි. ගස්මත වියළුණු කොළ හොඳ පෙනුමක් ඇති නමුත් සුළඟ පැමිණි විට ඒවා බිමට හැලේ. තම ධර්මිෂ්ඨකමේ කිළුටු වස්ත්‍ර ඇඳ සිටින්නා වූ මනුෂ්‍යයන්ව මම දැක තිබේ. නමුත් සුළඟ හැමූ විට සමහර පවුල් ප්‍රශ්න පැන නැගුන විට, සමහර ආර්ථික බැඳ වැටීම් පැමිණි විට යම් දුෂ්කරතා පැමිණි විට, ඔවුන් ඉවතට ගසාගෙන යයි.

අපි අපගේ පාප ගණන් නොගෙන සිටීම.

"ඔබගේ නාමය කියා යාච්ඤා කරන්නාවූ, ඔබ අල්වා ගන්නා පිණිස තමාව ප්‍රබෝධ කරගන්නා වූ කිසිවෙක් නැත. එක්නසාද ඔබ වහන්සේ ඔබගේ මුහුණ අපෙන් සඟවා අපේ අපරාධ නිසා අප දියව යන්ට හැරිය සේක." (යෙසායා 64:7) ඔබ දෙවියන් වහන්සේව අල්ලා ගැනීමට උද්‌යෝගිමත්ව පෙළඹී තිබෙනවාද ..? ඉරිදා උදෑසන දෙවස්ථානයට ගොස් එහි පුටු රත්කරන කෙනෙක් පමණක් වී සිටිනවාද .. ? ඔබ දේවස්ථානයට යාම නිසා ඔබ දෙවියන් වහන්සේට

Reg. No: Dop/News/36/2024
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

මහත් උදව්වක් කරනවා යැයි ඔබ සිතනවාද .. ? ඔබගේ හදවත පිඹීදීම උදෙසා දැඩි ආශාවෙන්, දැල්වෙමින් පිරී තිබෙනවාද ..? මේ කාල යුගයේ ශුද්ධවන්තයන්ගේ ආත්ම සිහිමුර්ජාවූ තත්ත්වයට පත්ව ඇත. "ආර්.ඒ ටෝරි" මෙසේ පැවසුවේය. මට මතවාදයක් තිබේ නමුත් එයින් සභාවටවත්, ලෝකයේ කොයි ස්ථානයක කරන සේවයකටවත් පිඹීදීම ගෙන ඒමට නොහැකිය. දෙවියන් වහන්සේ පහළට පැමිණෙන තෙක් අල්ලාගෙන සිටින කුඩා සෙනඟක් සිටින්නෝය. ප්‍රථමයෙන් කිතුණුවන් ස්වල්ප දෙනෙකුට දෙවියන් වහන්සේ සමඟ ඔවුන්ගේ ජීවිත හරිගස්වා ගැනීමට බොහෝ දෙනෙකු අවශ්‍ය නොවේ. මෙය මූලික අවශ්‍යතාවයකි. එය ඉටු නොකලොත් කණගාටුදායක දේ නම් ඉතිරි දේවල් කළ නොහැකි අතර එය නිශ්ඵල වනු ඇත. දෙවනුව, ඔවුන් දෙවියන් වහන්සේ ස්වර්ගය විවෘත කර පිඹීදීම එවන තෙක් සහ උන්වහන්සේ පහළට පැමිණෙන තෙක් එකට බැඳී යාච්ඤා කළ යුතුය. තුන්වෙනුව, ඔවුන් ඔවුන්ගේ ජීවිත පිළියෙල කර ගැනීමට ඉඩහැර ක්‍රිස්තුස් වහන්සේ වෙතට අනිත් අයව දිනා ගැනීමට දෙවියන් වහන්සේට පාවිච්චි කිරීමට පුළුවන් වූ අය ලෙස සිටිනවා උන්වහන්සේ දැකිය යුතුය. සිදුවිය යුත්තේ එපමණයි. මෙය ඕනෑම සභාවකට හෝ ඕනෑම ජන සමාජයකට පිඹීදීම ගෙන එන්නේය. මම මේ වට්ටෝරුව ලොව වඩා ලබා දී තිබේ. එය බොහෝ සභාවන් සහ ජන සමාජයන් ගඔහණය කර ගැනීමත් සමඟ එය විශේෂ අවස්ථාවලදී පමණක් නොව සැමදාම එය පවතින්නේය. එය අසාර්ථක නොවේ.

දෙවියන් වහන්සේ සමඟ හරිගැස්සෙන්න. එකට එකතුවී යාච්ඤා කරන්න. දෙවියන් වහන්සේගේ පෙළඹවීමට ඔබගේ ජීවිතය යොමු කරන්න. මෙය යෙසායා 64 වන පරිච්ඡේදයේ ඇති පණිවිඩයයි. මෙය ඉතා සරලයි කියා ඔබ පැවසිය හැකිය. එය සත්‍යයකි. එය සරලව තිබේ. එහි වෙන කිසිවක් නැත. උන්වහන්සේව අල්ලාගන්න පිණිස තමාවම ප්‍රබෝධ කරගන්නේ කවුද .. ? මිත්‍රවරුණි.., කළ යුත්තේ කුමක්ද .. ? දේවධර්මාචාර්යය ටෝරි පැවසුවේ, දෙවියන් වහන්සේ සමඟ හරි ගැස්සෙන්න කියාය. අපි එහෙම නොකලා නම් යම් දවසක එහෙම කළොත් එය යහපත්වේ.

අපගේ පාපය කරුණු කොටගෙන අප විනාශ වී ඇත.

"..... මක්නිසාද ඔබ වහන්සේ, ඔබගේ මුහුණ අපෙන් සඟවා අපේ අපරාධ නිසා අප දියව යන්ට හැරිය සේක." (යෙසායා 64:7) අපගේ පාපය අප ජීවත්ව සිටියදීම අපව විනශකර දමන්නේය. දෙවියන් වහන්සේ,

උන්වහන්සේගේ මුහුණ අප කෙරෙන් ඉවතට හරවා ගන්නා සේක. අපට ආරක්ෂාවක් නොමැත. දෙවියන් වහන්සේ අපගේ දේශයට ආශිර්වාද කරනවා යැයි අප ගායනා කළ හැකිය. නමුත් එය හිස්ව තිබේ. මක්නිසාද උන්වහන්සේගේ ආරක්ෂාවේ වැට බිඳදමා තිබේ.

අපට පිඹීදීම ලබා ගැනීමට හැකිවන්නේ කෙසේද .. ?

දෙවියන් වහන්සේගේ මුහුණ සෙවීමට අප කටයුතු කරන්නේ කෙසේද ..? පිඹීදීමට කලින් යාච්ඤා කිරීම පැවතිය යුතුය.

දෙවියන් වහන්සේගේ ස්වාධිපත්‍යය මතකයේ තබාගෙන යාච්ඤා කරන්න

"ඉතින් සාවිවීන් වහන්ස, ඔබ අපේ පියාණෙනි. අපි මැටිය. ඔබ අපේ කුම්භකාරයාය. අපි සියල්ලෝ ඔබගේ අතේ කර්මාන්තයය." (යොසායා 64:8) දෙවියන් වහන්සේ , දෙවියන් වහන්සේ බව අපි විශ්වාස කළ යුතුය. දෙවියන් වහන්සේගේ ස්වාධිපත්‍ය අප අවබෝධ කරගත යුතුය.

දෙවියන් වහන්සේට ඔබගේ ජීවිතයේ කැපී පෙනීමට අවශ්‍ය නැත. අපගේ ජීවිතයේ ප්‍රමුඛ ස්ථානය ඉල්ලා සිටීමට උන්වහන්සේ සුදුසුව සිටින සේක. ස්වාමීන් වහන්ස .., ඔබවහන්සේ ස්වාධිපත්‍යය ඇතිව සිටින සේක. මම මැටි පිඬක් වෙමි. ඔබවහන්සේගේ කැමැත්ත පරිදි මාව හැඩගැස්සුව මැනව. නිර්මාණය කළ මැනව. ඔබවහන්සේ රජතුමාණෙනි.

යාච්ඤා කරන්න එමෙන්ම දෙවියන් වහන්සේගේ දයාව මතකයේ තබාගන්න.

"ස්වාමීන් වහන්ස..., ඉතා උදහස් නුව මැනව. අයුතුකම් සැමකල්හි සිහි නොකළ මැනව. අනේ බැලුව මැනව. අපි සියල්ලෝම ඔබගේ සෙනඟය." (යෙසායා 64:9) දෙවියන් වහන්ස, ඔබවහන්සේගේ උදහස සදාකල්හිම තබානොගත මැනව. දයාව, කරුණාව දැක්වුව මැනව කියා යාච්ඤා කරන්න. ස්වාමීනි ...., ඔබ වහන්සේව අපට වුවමනාය. අප සමඟ ඔබවහන්සේ සිටිය යුතුය.

දෙවියන් වහන්සේට, උන්වහන්සේගේ කරුණාව පතුරුවා හැරීමට අවශ්‍යව තිබෙන සේක. පාපයට දඬුවම්දීමට වඩා සමාවදීමට උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. නමුත් පාපය සොලවනු ලබන විට අපි එය ඉවත්කර දමන තුරු දෙවියන් වහන්සේට අපට සමාවදී එය ඉවත්කර දැමීමට නොහැකිය. ප්‍රශ්නය වී තිබෙන්නේ බොහෝ විට අපි පසුතැවිලිවීමට කැමති නොවීමයි.

අපට දෙවියන් වහන්සේගේ කරුණාව අවශ්‍යව තිබෙන සෙක්. පසුතැවිලිවීමේ යාච්ඤා කිරීමක් නැති ආගමික ක්‍රියාවන් සුවඳ දුම් නිශ්ඵලය.

යාච්ඤා කරමින් දෙවියන් වහන්සේගේ තේජසට ගෞරව කරන්න.

"ඔබවහන්සේගේ ශුද්ධ නුවරවල් කාන්තාරයක් වී සියොන් කාන්තාරයක් වී, යෙරුසලම පාළුවී තිබේ. අපේ පියවරුන් විසින් ඔබ වර්ණනා කළා වූ අපේ ශුද්ධ වූ අලංකාර ගෘහය ගිනිනෙන් දවා තිබේ.

අපේ සියලු ප්‍රසන්න දේවල් නාස්තිවී තිබේ. ස්වාමීන් වහන්ස ..., ඔබ මේවා තිබෙද්දීත් නිකව් සිටිනසේකද .. ? ඔබ නිශ්ශබ්දව සිට අප තද දුකට පමුණුවනසේද ... ? " (යොසායා 64 : 10-12)

යෙසායා පවසන්නේ , දෙවියන් වහන්ස ..., ඔබවහන්සේගේ තේජස සිහි කරන්නෙමි. ඔබවහන්සේගේ ශුද්ධ මාළිගාවේ සිට අපට කථා කළ හැටි අපි සිහිකරන්නෙමු. අපේ පියවරු ඒ පිළිබඳව අපට කියා දී තේබ. එය කොපමණ අනර්ඝ කාලයක් ද ... ?

දෙවියන් වහන්ස .., ඔබවහන්සේගේ තේජස අපට නැවත අවශ්‍යව තිබේ. දෙවියන් වහන්ස, ඔබවහන්සේගේ මුහුණ බගේ තේජස අපට පෙන්වුව මැනව.

දෙවියන් වහන්ස පහළට පැමිණි විට මෙම පිඹීදීම සිදුවේ

ඔබ ඔබගේ ජීවිතය පුබුදුවා ගැනීමට කැමති නොවිය හැකිය. ඔබ ඔබගේම ධර්මිෂ්ඨකමේ වැරහැළි ඇඳගෙන සිටිනවා විය හැකි. ඔබ සිටින්නා වූ ස්ථානය පිළිබඳව ඔබ තෘප්තිමත් වී සිටිනවා විය හැකිය. පරවුනාවූ කොළයක් මෙන් වී සිටින නමුත් ඒ බව අවබෝධ කර නොගෙන සිටිනවා විය හැකිය.

නමුත් අපි දෙවියන් වහන්සේව සොයනවා නම්, දෙවියන් වහන්සේ ස්වර්ගීය ආරක්ෂක පවුරට ඉහළින් බලා සිටින සේක. පිඹීදීම එවන පිණිස දෙවියන් වහන්සේව පොළඹවා ගැනීමට අපට නුපුළුවන. උන්වහන්සේ ඉඩදෙනවා නම් පමණක් එසේ කළ හැකිය.

ඇත්තටම ඔබට පිඹීදීම දැකීමට අවශ්‍යව තිබෙනවාද ... ?

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මූලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.